බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
புத்தசாசனம் கலாசாரம் மற்றும் மத அலுவல்கள் அமைச்சு
Ministry of Buddhasasana Cultural and Religious Affairs

# 2023 වාර්ෂික වාර්තාව

**ටවර් හෝල් රඟහල පදනම**
**டவர் மண்டப அரங்க மன்றம்**
**Tower Hall Theatre Foundation**



# පටුන


**පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය**

1.1 හැදින්වීම .................................................................................... 3-4

1.2 ආයතනයේ දැක්ම,මෙහෙවර,අරමුණු ..................................................... 5

1.3 ප්‍රධාන කාර්යයන් ........................................................................... 6

1.4 සංවිධාන සටහන.............................................................................. 7

1.5 ටවර් හෝල් රඟහල පදනම යටතේ පවතින ප්‍රධාන අංශ.............................. 8

**පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම.................................................. 9-31**

**පරිච්ඡේදය 03 - වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය**

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය................................................................. 32

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය............................................................... 33-34

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය................................................................ 35-36

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්........................................................................... 37-57

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය..................................................... 57

3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය............... 57

3.7 මු.රෙ 208 ප්‍රකාරව,මෙම ආයතනයට ප්‍රධානය කරන ප්‍රතිපාදන.................. 58

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය .............................. 58

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව........................................................ 59-66

**පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක**

4.1 කාර්ය සාධන දර්ශක.......................................................................... 67

**පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG)සපුරා ගැනීමෙ කාර්ය සාධනය**

5.1 හඳුනාගන්නාලද තිරසාර සංවර්ධන අරමුණු............................................ 68-69

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාගැනීම ජයග්‍රහණය හා අභියෝග.............. 69-71

**පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය.............................................................. 72-75

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිගය හෝ අතිරික්තයට බලපාන ආකාරය..................................................................... 75-76

6.3 මානව සම්පත් සංවර්ධනය.................................................................... 76-77

**පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව.................................................... 78-84**

# පරිච්ඡේදය 01
# ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැඳින්වීම

ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම හා ප්‍රවර්ධනය කිරිම,නාට්‍ය,නැටුම් හා සංගීතය ඇතුළු ප්‍රාසාංගික කලාවන් පිළිබඳ පර්යේෂණ කිරීම ඒවා දිරිගැන්වීම සහ ටවර් රඟහල ජාතික රඟහලක් ලෙස ප්‍රයෝජනයට ගැනීම මුඛ්‍ය පරමාර්ථ කොට ගෙන නාට්‍ය හා රංගකලාවන් වෙනුවෙන් ස්ථාපිත ටවර් හෝල් රඟහල පදනම 1978 අංක 01 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත කරන ලදි. තවද කරුණු පහකින් සමන්විත අරමුණු ඉටු කර ගැනීම සඳහා පිහිටවු ආයතනයකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍යතුමාගේ සභාපතීත්වයෙන්යුතු පහළොස් දෙනෙකුගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් මඟින් පාලනය වේ.

ටවර් හෝල් රඟහල පදනම 2023 වර්ෂය පුරාවට වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදි.

- ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට රංගනය පිළිබඳ (Acting) NVQ පාඨමාලාවක් ද්විතීක හා තෘතීක අධ්‍යාපන කමිෂන් සභාවේ අනුමැතියෙන් හා NITA ආයතනයේ සහයෝගයෙන් ආරම්භ කිරීමට හැකිවිය.

  ශ්‍රී ලාංකීය වේදිකා,සිනමා හා ටෙලිනාට්‍ය ක්ෂේත්‍රයේ දැනට සිටින ශිල්පීන්ට හා ඒ කෙරෙහි උනන්දුවක් දක්වන ඕනෑම පුරවැසියෙකුට ඇතුලත්විය හැකිවන පරිදි මෙම පාඨමාලාව නිර්මාණය කරන ලදි.

  ශ්‍රී ලාංකීය රංගන ක්ෂේත්‍රයට අවශ්‍ය වෘතීය ශිල්පීන් බිහි කිරීම මෙහි පරමාර්ථය වන අතර ලොව ඕනෑම රටක පිළිගන්නා NVQ 4 සහතිකයක් මූලිකව පිරිනැමීමට කටයුතු කරන අතර ඉදිරියේදි මෙය NVQ 5,6,7 දක්වා සංවර්ධනය කිරීමට නියමිතය.

- ගුණතිලක සංප්‍රවේශය" කෘතිය එළිදැක්වීම හා ඊට සමගාමීව ටවර් නාට්‍යවේදී නාමාවලිය එළිදැක්වීම සිදුකරන ලදි.

- ටවර් නාට්‍ය පාසලේ සිංහල මාධ්‍ය පාඨමාලාව සඳහා මෙම වර්ෂය තුල සිසුන් 65 දෙනෙකු ඇතුලත් කර ගන්නා ලද අතර යාපනයේ ආරම්භ කල දෙමළ මාධ්‍ය පාඨමාලාව සඳහා සිසු සිසුවියන් 60 දෙනෙකු ඇතුලත් කරගන්නා ලදි.

  ඒ අනුව,ශ්‍රී ලාංකීය රංගනකලා ක්ෂේත්‍රයට නවක පුහුණුලාභීන් 125 ක් සිංහල හා දෙමළ මාධ්‍යන්ගෙන් ඇතුලත් කර ගැනීමට හැකි විය.එමෙන්ම SLQF 3 හා 4 මට්ටම සම්පූර්ණ කල සිසු සිසුවියන් 45 දෙනෙකු සඳහා උසස් ඩිප්ලෝමා පාඨමාලාව ලබාදුන් අතර ඔවුන් සියලු දෙනා විවෘතවිශ්ව විද්‍යාලය සඳහා යොමු කරන ලදි.

- පදනම සතු රංගශාලා වෙත ප්‍රේක්ෂකයා ආකර්ෂණය කරගැනීමත් නිර්මාණකරුවන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමත් අරමුණු කරගනිමින් අපේක්ෂාවේ වේදිකා මංගල්‍ය ටවර් නාට්‍ය උළෙල පවත්වන ලද අතර එහිදි නාට්‍ය 39 ක් ප්‍රදර්ශනය කරන ලදි. ඒ සඳහා ප්‍රේක්ෂකයන් 15000 ට අධික සංඛ්‍යාවක් සහභාගීවන ලදි.
  එමෙන්ම අපේක්ෂාවේ වේදිකා මංගල්‍ය දෙමළ නාට්‍ය උළෙල යාපනය යුනියන් විද්‍යාලයේ අති උත්කර්ෂවත්ව පවත්වන ලද අතර එහිදී දෙමළ නාට්‍ය 10 ක් ප්‍රදර්ශනය කල අතර,ඒ සඳහා 8000 අධික ප්‍රේක්ෂක ජනතාවක් එම නාට්‍ය නරඹන ලදි.

- කෘතහස්ත සංගීතවේදියෙකු වන කලාභූෂණ ලයනල් ගුණතිලකයන් විසින් නෘත්‍ය සංගීත කලාවට සිදුකළ වූ මෙහෙවර අලලා චන්දි සුද්දත්වාරි මහත්මිය විසින් රචනා කරන ලද "ලාංකේය නෘත්‍ය සංගීත කලාවේ ලයනල්

- නූර්ති,නාඩගම්,ටීටර්,ග්‍රැමෆෝන් යුගයන්හිදි ප්‍රදර්ශනය කරන ලද නාට්‍ය හා එකල ජනප්‍රිය ගීත වර්තමාන සමාජයේ රසවිඳීම,සංරක්ෂණය

කිරීම අරමුණු කරගනිමින් පාසල් සිසුන් ගුරුවරුන් හා සාමාන්‍ය ජනයා ඉලක්ක කරගනිමින් නිර්මාණය කරන ලද ටවර් ප්‍රභාෂ්වර ප්‍රසංගයෙහි වැඩසටහන් 04 ක් ක්‍රියාත්මක කල අතර,එම වැඩසටහන් සඳහා පාසල් සිසුන්,ගුරුවරුන් හා සාමාන්‍ය ජනතාව 6000 ට අධික සංඛ්‍යාවක් සහභාගී වී නිර්මාණ රසාස්වාදය කරන ලදි.

තවද,ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංගකලාවේ ඓතිහාසික විකාශනය පිළිබඳ දැනුම හා අවබෝධය හා රසවින්දනය පාසල් සිසු සිසුවියන් හා ගුරුවරුන් වෙත ලබා දීමේ අරමුණින් නිර්මාණය කල ටවර් රංග යාත්‍රා වැඩසටහන් 02 ක් ක්‍රියාත්මක කල අතර ඒ සඳහා ප්‍රේක්ෂකයන් 1500 වැඩි පිරිසක් සහභාගී විය.

- ❖ පාසල් සිසු සිසුවියන්ගේ නාට්‍ය හා රංගකලා ක්ෂේත්‍රයට යොමු කර ගැනීමේ පරමාර්තය සහිතව අධ්‍යාපන අමාත්‍යාංශය ඒකාබද්ධව ක්‍රියාත්මක කරන සමන්ප ලංකා පාසල් නාට්‍ය තරගාවලිය පුහුණු වැඩසටහන් පැවැත්වීම පළාත් 09 ආවරණය වන පරිදි පළාත් මට්ටමේ තරඟ සියල්ල අවසන් කොට ජාතික තරඟාවලිය පවත්වා අතිඋත්කර්ෂවත් ලෙස තිළිණ හා සම්මාන ප්‍රධානෝත්සවය එල්ෆින්ස්ටන් රඟහලේදී පවත්වන ලදි.

මෙම සම්මාන උළලේදී ජයග්‍රහයකයින් සඳහා පිරිනැමුනු සමස්ථ සම්මාන සංඛ්‍යාව 118 ක් වන අතර ජයග්‍රාහකයින් සඳහා සහතිකපත්,මුදල් ත්‍යාග,සම්මාන හා ජාතික තරගාවලිය නියෝජනය කළ පාසල් 38 සඳහාම පාසල් පුස්තකාලය සඳහා පොත් කට්ටලය බැගින්ද මෙදින ප්‍රධානය කෙරිණි.තවද මෙම සම්මාන උළෙල සඳහා මූල්‍ය අනුග්‍රහය පුද්ගලික අංශයෙන් ලබා ගැනීමට හැකි විය.

- ❖ වේදිකා නාට්‍ය ක්ෂේත්‍රයට සුවිශේෂී දායකත්වයක් සැපයූ වියපත් ශිල්පීන් සඳහා සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් රු 10000.00 බැගින් වටිණා තිළින පත් දීමනා ලබන ටවර් ශිල්පීන් 44 දෙනෙකු වෙනුවෙන් ප්‍රදානය කෙරුණු අතර,ටවර් හෝල් රඟහල පදනමේ මුඛ්‍ය පරමාර්ථය වන වියපත් කලා කරුවන් ආරක්ෂා කිරීම වෙනුවෙන් වන ජීවනාධාරය මෙවරත් අඛන්ඩව ලබා දෙන ලදි.

තවද,වියපත් කලා කරුවන් වෙනුවෙන් වාර්ෂිකව සංවිධානය කරනු ලබන වන්දනා වාරිකාව මෙවර ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිළමේ නිලංග දැල බණ්ඩාර මැතිතුමාගේ අනුග්‍රාහකත්වය යටතේ ක්‍රියාත්මක කෙරුණි.

එසේම ටවර් හොල් රඟහල පදනමේ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් හා ප්‍රවර්ධනය වෙනුවෙන් YOUTUBE නාලිකාවක් ආරම්භ කරන ලදි.

- ❖ ටවර්,එල්ෆින්ස්ටන්,රුක්මණිදේවි යන රඟහල් තුනේ බිදවැටී පැවති ආදායම සාර්ථක ලෙස වර්ධනය කර ගැනීමට මෙම වසර තුල හැකි විය. ඒ සඳහා අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමන් ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ උපදේශකත්වය,අධීක්ෂණය සියලු කටයුතු සාර්ථක කර ගැනීම උදෙසා ප්‍රයෝජනවත් විය.

## 1.2 ආයතනයේ දැක්ම,මෙහෙවර,අරමුණු

# දැක්ම

"නාට්‍ය ඇතුළු ප්‍රාසාංගික කලාවන්හි ගුණාත්මක සංස්කෘතියක් බිහිකිරීමෙහිලා දකුණු ආසියාවේ ප්‍රමුඛතම ආයතනයක් බවට පත්වීම"

# මෙහෙවර

නාට්‍ය ඇතුළු ප්‍රාසාංගික කලා සම්ප්‍රදායන් ආරක්ෂාකර ගනිමින් නව නිර්මානකරණය හා පර්යේෂණ සඳහා නිර්මානවේදීන් ඇතුළු ක්ෂේත්‍රය කෙරේ උනන්දුව දක්වන ප්‍රජාව යොමු කරවීම හා ඊට අදාල වන යටිතල පහසුකම් වැඩිදියුණු කරමින් ගුණාත්මක නාට්‍ය ඇතුළු ප්‍රාසාංගික කලා සංස්කෘතියක් බිහි කිරීම සඳහා අවශ්‍යවන මංපෙත් විවර කිරීම.

# අරමුණු හා පරමාර්ථ

- ජාතික නාත්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම.
- රඟහල පිළිබඳ දැනුම අවබෝධය සහ එහි භාවිතය වර්ධනය කිරීම හා දියුණු කිරීම.
- රඟහල් නාට්‍ය කලාකරුවන්ට හා ශිල්පීන්ට මුදලින් උපකාර කිරීම හා නාට්‍ය කලාකරුවන් පුහුණු කිරීමෙහිලා සහාය වීම.
- ගීත නාට්‍ය, නැටුම් නාට්‍ය හා සංගීතය නිෂ්පාදනය කිරීමේ, ඒ පිළිබඳ පරීක්ෂණ කිරීමේ සහ ඒවා රඟදැක්වීමේ නියුතු වීම හා ඒ පිළිබඳ අධ්‍යාපනය ලබා දීම.
- පක්ෂග්‍රාහී දේශපාලනමය කාර්යයන් සඳහා රඟහල ප්‍රයෝජනයට නොගතයුතුවන ලෙස ඉහත දක්වා ඇති පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහාද සුදුසුයැයි මණ්ඩලය සලකන වෙනත් කාර්යයන් සඳහා ද ටවර් හෝල් රඟහල ජාතික සිහිවටනයක් ලෙස පුනස්ථාපනය කිරීම, ආරක්ෂා කිරීම, පවත්වාගෙන යාම සහ ප්‍රයෝජනයට ගැනීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

1.ජාතික නෘත්‍ය කටයුතු දිරිගැන්වීම හා ප්‍රවර්ධනය කිරීම.

2.රඟහල පිළිබඳ දැනුම,අවබෝධය හා එහි භාවිතය වර්ධනය කිරීම හා දියුණු කිරීම.

3.රඟහල නාට්‍ය කලාකරුවන්ට හා ශිල්පීන්ට මුදලින් උපකාර කිරීම හා නාට්‍ය කලාකරුවන් පුහුණු කිරීමෙහිලා සහය වීම.

4.ගීත නාට්‍ය,නැටුම් හා සංගීතය නිෂ්පාදනය කිරීම ඒ පිළිබඳ පරීක්ෂණ කිරීමේ හා ඒවා රඟදැක්වීමේ නියුක්ත වීම.

5.ටවර් හෝල් රඟහල ජාතික සිහිවටනයක් ලෙස පුනස්ථාපනය කිරීම,ආරක්ෂා කිරීම,පවත්වාගෙන යාම හා ප්‍රයෝජනයට ගැනීම.

# 1.4 සංවිධාන සටහන

**- සංවිධාන සැලැස්ම -**




බඳවාගැනීමේ පරිපාටි අනුව අනුමත තනතුරු සංඛ්‍යාව - **91**

★ දරන්නාට පමණක් පුද්ගලික වන තනතුරු **03**

**එකතුව** **94**

## 1.5 පදනම යටතේ පවතින ප්‍රධාන අංශ

1.5.1 පාලන හා සංවර්ධන අංශය

1.5.2 මුදල් අංශය

1.5.3 නාට්‍ය ප්‍රවර්ධන කලාකරු සුභසාධන හා වැඩසටහන් අංශය

1.5.4 දෙමළ නාට්‍ය ප්‍රවර්ධන අංශය

1.5.5 අධ්‍යාපන පර්යේෂණ හා සංරක්ෂණ අංශය

1.5.6 ටවර් හෝල් රඟහල - මරදාන

1.5.7 එල්ෆින්ස්ටන් රඟහල - මරදාන

1.5.8 රුක්මණීදේවි රංගශිල්ප කේන්ද්‍රය - මීගමුව

1.5.9 ශබ්දාගාරය - කොළඹ 07

1.5.10 නාට්‍ය හා රංගකලා පාසල (සිංහල මාධ්‍ය) - කොළඹ

1.5.11 නාට්‍ය හා රංගකලා පාසල (දමිළ මාධ්‍ය) - යාපනය

## පරිච්ඡේදය 02

## ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### අපේක්ෂාවේ වේදිකා මංගල්‍යය “ටවර් නාට්‍ය උළෙල - 2023”

ටවර් හෝල් රඟහල පදනම විසින් පවත්වනු ලැබූ අපේක්ෂාවේ වේදිකා මංගල්‍යය “ටවර් නාට්‍ය උළෙල - 2023" ජනවාරි 09 සිට 24 දක්වා පස්වරු 3.30 ට හා 6.30 ට මරදාන ටවර් හා එල්ෆින්ස්ටන් රඟහල් වලදී පැවැත්විණි.




වේදිකා නාට්‍ය කලාවට නව ජීවයක් ලබාදීමත්, නාට්‍ය රසික ප්‍රජාව නැවතත් රඟහල් වටා එක්රොක් කිරීමත් අරමුණු කරගනිමින් ක්‍රියාත්මක කරන ලද, ටවර් නාට්‍ය උළෙලේ දී දිගු නාට්‍ය 25 ක්, කෙටි

නාට්‍ය 12 ක් හා ළමා නාට්‍ය 02 ක් වශයෙන් නාට්‍ය ප්‍රදර්ශනය කෙරිණි.

මෙහි සමාරම්භක දින උත්සවය බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය, විදුර වික්‍රමනායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි.














**නෘත්‍ය හා ග්‍රැමර්ෆෝන් සංගීතයේ ලයනල් ගුණතිලකයන්ගේ දායකත්වය, කෘතිය එළිදැක්වීම හා ඊට සමගාමීව ටවර් නාට්‍යවේදී නාමාවලිය එළිදැක්වීම**

වසර විසිහයක් පුරා ටවර් හෝල් රඟහල පදනම සමඟ අත්වැල් බැඳගනිමින්, දේශීය නාට්‍ය කලාවේ උන්නතිය උදෙසා ඉමහත් මෙහෙවරක් ඉටුකළ කෘතහස්ත සංගීතවේදියෙකු වන කලාභූෂණ ලයනල් ගුණතිලකයන් විසින් නෘත්‍ය සංගීත කලාවට සිදුකළාවූ මෙහෙවර අලලා චන්දි සුද්දත්වාරී මහත්මිය විසින් රචනා කරන ලද "ලාංකේය නෘත්‍ය සංගීත කලාවේ ලයනල් ගුණතිලක සංප්‍රවේශය" කෘතිය එළිදැක්වීමේ උත්සවය 2023.02.17 දින සව්සිරිපාය ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි.





ලාංකේය නෘත්‍ය සංගීත කලාවේ ලයනල් ගුණතිලකයන්ගේ දායකත්වය මැයෙන් විශේෂ දේශනයක් ප්‍රවීණ ගීත රචක සුනිල් සරත් පෙරේරා මහතා විසින් පැවැත්වූ අතර, මීට සමගාමීව ටවර් හෝල් රඟහල පදනම විසින් නිෂ්පාදිත ටවර් නාට්‍යවේදී නාමාවලිය එළිදැක්වීමට ද කටයුතු කෙරිණි.

උත්සව අවස්ථාව වර්ණවත් කරමින් නාට්‍ය භූෂණ, නාට්‍යකලා චූඩාමණී ශ්‍රී ජයත කරුණාසේකර මහතාගේ ජයසංඛ රංග පදනමේ සරසවිපාය සිසු සිසුවියන් විසින් සරස්වතී අභිනන්දන රංගනය ඉදිරිපත් කළ අතර, ටවර් නාට්‍ය හා රංගකලා පාසලේ ආදි විද්‍යාර්ථීන් විසින් ද නර්තනාංගයක් ඉදිරිපත් කරන ලදී.



මෙම අවස්ථාව සඳහා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය, විදුර වික්‍රමනායක මහතා, ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක මහතා, කලාශිල්පීන් හා සාහිත්‍යවේදීන් රැසක් සහභාගී විය.

## ටවර් ප්‍රභාස්වර ප්‍රසංගය – දෙවන දිගහැරුම



ශ්‍රී ලාංකේය ජනතාවගේ රසාස්වාදය වර්ධනය කිරීමත්, නිර්මාණකරුවන් දිරිමත් කරමින්, යළි යළි නිර්මාණකරණයේ යෙදවීමත් උදෙසා නූර්ති කලාවේ සුවිශේෂීම යුගය ලෙස හැඳින්වෙන ටවර් හෝල් යුගයේ වඩා ජනප්‍රියත්වයට පත්වූ නූර්ති, නාඩගම්, ටීටර් ජවනිකා හා ග්‍රැමර්ෆෝන් ගී ඇතුළත් නැවුම් ප්‍රසාංගික අත්දැකීම, ටවර් යුගයේ නූතන සම්ප්‍රාප්තිය “ටවර් ප්‍රභාස්වර“ ප්‍රසංගය 2023 මාර්තු 07 දින රඹකැන්ඔය මහවැලි කලාපයේ මහඔය කැප්පෙටිපොළ මහා විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී ආදිවාසී නායක ඌරුවරිගේ වන්නිල ඇත්තන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි.

මෙම අවස්ථාව සඳහා මහඔය, පොල්ලෙබැද්ද ආදීවාසී ජනතාව, මහඔය ප්‍රදේශවාසීන්, මහඔය කැප්පෙටිපොළ මහා විද්‍යාලයේ සිසු දරු දැරියන්, ආචාර්ය මණ්ඩලය, රඹකැන්ඔය මහවැලි කලාපයේ නේවාසික ව්‍යාපාර කළමණාකාර තිලකරත්න මහතා, මහඔය ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරී, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ රඹකැන්ඔය කලාපයේ නිලධාරීන් හා ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක මහතා ද සහභාගී විය.





## ටවර් හෝල් රඟහල පදනම YouTube නාලිකාව ආරම්භ කිරීම

ටවර් හෝල් රඟහල පදනම විසින් Tower Hal Theatre Foundation YouTube Channel නමින් YouTube නාලිකාවක් 2023.03.09 දින සිට ආරම්භ කරන ලදී.
















## කලාකරුවන්ගේ අලුත් අවුරුදු තිළිණ ප්‍රදානය

ටවර් වේදිකාව තුල වසර ගණනාවක් පුරා දක්ෂතා ප්‍රකට කරමින්, වේදිකා නාට්‍ය ක්ෂේත්‍රයට සුවිශේෂී දායකත්වයක් සැපයූ වියපත් ටවර් ශිල්පීන් සඳහා අලුත් අවුරුදු තිළිණ ප්‍රදානය 2023 අප්‍රේල් මස 11 දින කොළඹ 07, විජේරාම මාවතේ පිහිටි සච්සිරිපාය පරිශ්‍රයේ දී පැවැත්විණි.

සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් ටවර් හෝල් රඟහල පදනම මගින් කලාකරුවන් සඳහා අලුත් අවුරුදු තිළිණ ප්‍රදානය වාර්ෂිකව සිදුකරනු ලබයි. මෙවර රු. 10,000/- බැගින් වටිනා තිළිණ පත්, දීමනා ලබන ටවර් ශිල්පීන් 44 දෙනෙකු වෙත ප්‍රදානය කෙරුණි.



මෙම අවස්ථාව සඳහා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය, විදුර වික්‍රමනායක මැතිතුමා, එම අමාත්‍යාංශයේ උරුම අංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) නිශාන්ති ජයසිංහ මහත්මිය හා ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක මහතා සහභාගී විය.









# රංගනය පිළිබඳ NVQ පාඨමාලාව ආරම්භ කිරීම

ටවර් හෝල් රඟහල පදනම විසින් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ නියාමනයන්ට අනුරූපව, වේදිකා නාට්‍ය, ටෙලි නාට්‍ය හා චිත්‍රපට රංගනය සඳහා අවශ්‍ය කෙරෙන ප්‍රායෝගික වෘත්තීමය කුසලතාවය ලබාදීමේ අරමුණින්, රංගනය පිළිබඳ උනන්දුවක් දක්වන හා මේ වන විටත් රංගන ක්ෂේත්‍රයේ නිරතවූවන්ට සහභාගී විය හැකි පරිදි රංගනය පිළිබඳ NVQ පාඨමාලාවක් ආරම්භ කරන ලදී.

පාඨමාලාව හැදෑරීම සඳහා අධ්‍යාපන සුදුසුකම් අවශ්‍ය නොවන අතර, සම්පූර්ණ පාඨමාලාව ප්‍රායෝගික ක්‍රියාකාරකම් හරහා ක්‍රියාත්මක කෙරේ.

රංගනය පිළිබඳ උනන්දුවක් දක්වන ඕනෑම අයෙකුට මේ සඳහා සම්බන්ධවීමට ටවර් හෝල් රඟහල අවකාශ සළසා දී ඇත. පාඨමාලාවට අදාළ ප්‍රායෝගික දේශන 2023 අප්‍රේල් 22 සිට ආරම්භ කෙරිණි.

මෙම වැඩසටහනේ සමාරම්භය 2023 අප්‍රේල් මස 08 සවිසිරිපාය පිහිටි ටවර් හෝල් රඟහල පදනම ප්‍රධාන කාර්යාලයේ දී පැවති අතර, ප්‍රවීණ නාට්‍යවේදී මහාචාර්ය මංගල සේනානායක, ශ්‍රී ජයවර්ධන පුර විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය සෙනේෂ් බණ්ඩාර දිසානායක, ප්‍රවීණ රංගන ශිල්පී විල්සන් ගුණරත්න, ප්‍රවීණ රංගන ශිල්පී ටවර් හෝල් රඟහල පදනමේ භාරකාර මණ්ඩල සාමාජික පාලිත සිල්වා, ප්‍රවීණ රංගන ශිල්පී ශ්‍රියන්ත මෙන්ඩිස් හා ප්‍රවීණ නාට්‍යවේදී ජෙරම් ද සිල්වා යන මහත්වරුන් මෙම අවස්ථාවට සහභාගී විය.











## ටවර් ප්‍රභාස්වර ප්‍රසංගය - තෙවන දිගහැරුම

ශ්‍රී ලාංකේය ජනතාවගේ රසාස්වාදය වර්ධනය කිරීමත්, නිර්මාණකරුවන් දිරිමත් කරමින්, යළි යළි නිර්මාණකරණයේ යෙදවීමත් උදෙසා නූර්ති කලාවේ සුවිශේෂීම යුගය ලෙස හැඳින්වෙන ටවර් හෝල් යුගයේ වඩා ජනප්‍රියත්වයට පත්වූ නූර්ති, නාඩගම්, ටීටර් ජවනිකා හා ග්‍රැමර්ෆෝන් ගී ඇතුළත් නැවුම් ප්‍රසාංගික අත්දැකීම, ටවර් යුගයේ නූතන සම්ප්‍රාප්තිය "ටවර් ප්‍රභාස්වර" ප්‍රසංගයේ තෙවන දිගහැරුම රාජ්‍ය වෙසක් උළෙල නිමිතිකොට ගනිමින්, හලාවත කැබැල්ලෑවල ශ්‍රී රත්නසිරි පිරිවෙන් විහාරස්ථානයේ දී 2023 මැයි මස 06 වැනි දින පැවැත්විණි.




## ටවර් බොදු බැති ගී ප්‍රසංගය

ශ්‍රී බුද්ධ වර්ෂ 2567 අසිරිමත් සම්බුදු තෙමඟුල නිමිත්තෙන් කොළඹ ගංගාරාම විහාරස්ථානය, ජනාධිපති කාර්යාලය හා අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සංවිධානය කරනු ලැබූ බුද්ධ රශ්මි ජාතික වෙසක් මංගල්‍යය සඳහා ''බොදු බැති ගී ප්‍රසංගයක්'' ටවර් වේදිකාව ඒකාලෝකමත් කල ප්‍රකට ගායක ගායිකාවන් රැසකගේ සහභාගීත්වයෙන් 2023 මැයි මස 07 වැනි දින පස්වරු 9.30 ට බේරේවැව මධ්‍යයේ පිහිටි එළිමහන් වේදිකාවේ දී (බාච්) පැවැත්විණි.



## ටවර් ප්‍රභාස්වර ප්‍රසංගය - සිව්වැනි දිගහැරුම

ශ්‍රී ලාංකේය ජනතාවගේ රසාස්වාදය වර්ධනය කිරීමත්, නිර්මාණකරුවන් දිරිමත් කරමින්, යළි යළි නිර්මාණකරණයේ යෙදවීමත් උදෙසා නූර්ති කලාවේ සුවිශේෂීම යුගය ලෙස හැඳින්වෙන ටවර් හෝල් යුගයේ වඩා ජනප්‍රියත්වයට පත්වූ නූර්ති, නාඩගම්, ටීටර් ජවනිකා හා ග්‍රැමර්ෆෝන් ගී ඇතුළත් නැවුම් ප්‍රසාංගික අත්දැකීම, ටවර් යුගයේ නූතන සම්ප්‍රාප්තිය ''ටවර් ප්‍රභාස්වර''





ප්‍රසංගයේ සිව්වැනි දිගහැරුම බුද්ධශාසන, ආගමික හා සාංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මගපෙන්වීමෙන්, ඉංගිරිය පොසොන් කලාපය වෙනුවෙන් ජනප්‍රිය ගායක ගායිකාවන් රැසකගේ සහභාගිත්වයෙන් 2023 ජුනි මස 07 වැනි දින ඉංගිරිය බස්නැවතුම්පොළ අසලදී පැවැත්විණි.

## සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගාවලිය (සිංහල හා දෙමළ) -2022/ 2023

## පළාත් වටයේ තරග විනිශ්චය

සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගාවලිය - 2022/2023 හි මධ්‍යම, නැගෙනහිර හා උතුරු මැද පළාත් තරග විනිශ්චය 2023 ජූලි මස 01, 02 හා 03 දින වලදීත්, ඌව හා දකුණු පළාත් තරග විනිශ්චය ජූලි මස 08, 09 හා 10 දින වලදීත්, බස්නාහිර, වයඹ හා සබරගමු පළාත් තරග විනිශ්චය ජූලි මස 22 හා 23 දින වලදීත්, දෙමළ මාධ්‍ය තරග විනිශ්චය ජූලි 29, 30, 31 හා අගෝස්තු 01 හා 02 යන දින වලදීත් ඒ ඒ පාසල් හිදී පැවැත්විණි.







මෙහි සිංහල මාධ්‍ය අංශය සඳහා විනිශ්චය මණ්ඩල සාමාජිකයින් ලෙස ප්‍රවීණ නාට්‍යවේදී නිමල් ජයසිංහ මහතා, ප්‍රවීණ අංගරචනා ශිල්පී ජයන්තා රණවක මහතා හා ප්‍රවීණ සංගීතඥ සාන්ත සෙනරත් යාපා මහතා සහභාගී වූ අතර, දෙමළ මාධ්‍ය අංශය සඳහා ප්‍රවීණ නාට්‍යවේදී මුනියන්ඩි කාලිදාස් මහතා, ප්‍රවීණ සංගීතඥ සුරදි ප්‍රභා මහතා හා ප්‍රවීණ නාට්‍යවේදී ශංමුග ෂර්මා ජයප්‍රකාශ් යන මහත්වරුන් සහභාගී විය.

## සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගාවලිය (සිංහල හා දෙමළ)- 2022/ 2023

## දෙදින නේවාසික පුහුණු වැඩමුළුව



සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගාවලිය 2022/2023 හි අවසාන වටය සඳහා සුදුසුකම් ලැබූ නාට්‍ය 39 හි නාට්‍ය අධ්‍යක්ෂවරුන් හා නූර්ති නාට්‍ය ජවනිකා අංශයේ සංගීත අධ්‍යක්ෂවරුන් සඳහා 2023 සැප්තැම්බර් 04 සහ 05 දිනයන්හි වේයන්ගොඩ ජාතික සංස්කෘතික පුහුණු මධ්‍යස්ථානයේ දී දෙදින නේවාසික පුහුණු වැඩමුළුවක් පැවැත්වුණි.



මෙහිදී ඔවුන් වෙත ගුණාත්මක නාට්‍ය නිර්මාණයක් ඉදිරිපත් කිරීම සඳහා වන නාට්‍ය අධ්‍යක්ෂණය, පිටපත් රචනය, නාට්‍ය සංගීතය, අංගරචනය, වේදිකා පසුතල නිර්මාණය හා රංගනය යන අංශයන් ආවරණය වන පරිදි ප්‍රායෝගික පුහුණුව ලබා දෙන ලදී.

## සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගාවලිය (සිංහල හා දෙමළ)- 2022/ 2023

## අවසාන වටයේ තරග විනිශ්චය

සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගාවලියේ අවසාන වටය සඳහා සුදුසුකම් ලැබූ කෙටි නාට්‍ය 10 ක් 2023 සැප්තැම්බර් 25 දිනයේ දීත්, නූර්ති නාට්‍ය ජවනිකා 09 ක් 2023 සැප්තැම්බර් මස 26 දිනයේ දීත්, දිගු නාට්‍ය 10 න් 09 ක් 2023 සැප්තැම්බර් 27 හා 28 දිනයන්හිදීත්, දෙමළ මාධ්‍ය කෙටි නාට්‍ය 10 ක් 2023 සැප්තැම්බර් 29 දිනයේ දීත් මරදාන ටවර් රඟහලේ දී වේදිකා ගත කෙරිණි.

මෙහි එක් එක් නාට්‍ය අංශය සඳහා සාමාජිකයින් 05 කින් සමන්විත විනිශ්චය මණ්ඩල කණ්ඩායම් 04 ක් තරග විනිශ්චය සඳහා සහභාගී විය.








## කලාකරුවන් සඳහා වන්දනා චාරිකාවක් සංවිධානය කිරීම

ටවර් හෝල් රඟහල පදනම විසින් වියපත් කලාකරුවන් වෙනුවෙන් වාර්ෂිකව සංවිධානය කරනු ලබන වන්දනා චාරිකාව මෙවර ශ්‍රී දළදා මාළිගාවේ දියවඩන නිළමේ නිලංග දැල බණ්ඩාර මැතිතුමාගේ හා මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලලිත් යූ. ගමගේ මහතාගේ අනුග්‍රාහක දායකත්වය ද සහිතව 2023 ඔක්තෝම්බර් 20 වියපත් කලාකරුවන් උදෙසා ක්‍රියාත්මක කෙරිණි.

එහිදී මහනුවර ශ්‍රී දළදා මාළිගාව වැද පුදා ගැනීමට ඔවුන් හට අවස්ථාව හිමිවූ අතර, අනතුරුව දළදා මාළිගාවේ මාධ්‍ය ඒකකය මගින් පිරිනැමූ තේ පැන් සංග්‍රහය භුක්ති විදීමටත් අවස්ථාව හිමිවිය.









මෙම වන්දනා චාරිකාව සඳහා සහභාගී වූ කලාකරුවන්ගේ සහභාගීත්වයෙන් මධ්‍යම පළාත් ආණ්ඩුකාර නිල නිවසේ දී ප්‍රසංගයක් පැවැත්වීමටත්, එහි දී දිවා භෝජන සංග්‍රහයක් බුක්ති විදීමටත් හැකියාව ලැබුණි. මෙම අවස්ථාව සඳහා මධ්‍යම පළාත් බෞද්ධ කටයුතු කොමසාරිස් අනුරුද්ධ බණ්ඩාර මහතා ද එක්විය.

වේදිකාව තුල සිය රංගන, ගායන කුසලතා විදහා දක්වමින්, කලාව උදෙසාම සිය ජීවිතය කැප කළ, ජනාධිපති සම්මානයෙන් පිදුම් ලැබූ ප්‍රවීණ රංගන ශිල්පී විජේරත්න වරකාගොඩ, සඳුන් විජේසිරි, ජීවන් හඳුන්නෙත්ති, දයා වයමන්, ප්‍රසන්න ෆොන්සේකා, උදේනි චන්ද්‍රසිරි සමගින් රංගන ශිල්පිනී චිත්‍රා වරකාගොඩ, රත්නා සුමනපාල, කුසුම් සෙලානි පෙරේරා, කුමාරි පෙරේරා, රංජනී පෙරේරා, කුමාරි අත්තනායක, ලාලනී සෝමසිරි, ප්‍රවීණ සංගීතඥ රංජිත් යාපා ද අල්විස් ඇතුළු ශිල්පීන් පිරිසක් හා ටවර් හෝල් රඟහල පදනමේ නාට්‍ය ප්‍රවර්ධන, කලාකරු සුභ සාධන හා වැඩසටහන් අංශයේ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලය ද එක්විය.

## ටවර් ප්‍රභාස්වර ප්‍රසංගය – පස්වැනි දිගහැරුම

සඳලංකාව ජාතික පාසලේ කලා අංශය විසින් සංවිධානය කළ "සඳලක් සාහිත සොබා" කලා උළෙලට සමගාමීව, නූර්ති කලාවේ සුවිශේෂීම යුගය ලෙස හැඳින්වෙන ටවර් හෝල් යුගයේ වඩා ජනප්‍රියත්වයට පත්වූ නූර්ති, නාඩගම්, ටීටර් ජවනිකා හා ග්‍රැමර්ෆෝන් ගී ඇතුළත් නැවුම් ප්‍රසාංගික අත්දැකීම, ටවර් යුගයේ නූතන සම්ප්‍රාප්තිය "ටවර් ප්‍රභාස්වර" ප්‍රසංගයේ පස්වැනි දිගහැරුම, 2023 නොවැම්බර් 24 දින පාසල් දූ දැරියන් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් සඳලංකාව ජාතික පාසලේ දී පැවැත්විණි.

ජනතා ආදරයට පාත්‍ර වූ ප්‍රසන්නජිත් අබේසූරිය, සඳුන් විජේසිරි, සුදත් සමරසිංහ, රත්නා ලාලනී ජයකොඩි,

කාංචනමාලා මහවිතාන, ෆර්නි රෝෂිණී, ජීවන් හඳුන්නෙත්ති, රුවන් දනන්සූරිය, පැතුම් දනන්සූරිය, ඉවංකා පීරිස්, ඩබ්. නිමල් ජයසිංහ, චමින්ද මැදගෙදර ඇතුළු ජනප්‍රිය රංගන හා ගායන ශිල්පීන් රැසකගේ සහභාගීත්වයෙන් පැවති මෙම ප්‍රසංග නැරඹීම සඳහා සඳලංකාව ජාතික පාසල අවට පාසල් 08 ක දරු දැරියන් අති විශාල සංඛ්‍යාවක් සහභාගී විය.















**<u>ජයග්‍රහන</u>**

**සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගාවලිය (සිංහල හා දෙමළ) – 2022/ 2023**
**තිළිණ හා සම්මාන ප්‍රදානෝත්සවය**




ටවර් හෝල් රඟහල පදනම, අධ්‍යාපන අමාත්‍යාංශය හා ඒකාබද්ධව නූර්ති නාට්‍ය කලාවේ ප්‍රගමණය උදෙසාත්, කෙටි හා දිගු නාට්‍ය කලාවන්හි උන්නතිය උදෙසාත්, නිර්මාණශීලී රසඥතාවෙන් පිරිපුන් ප්‍රඥාසම්පන්න පුරවැසියන් බිහිකිරීම ඉලක්ක කර ගනිමින්, සංවිධානය කරනු ලැබූ සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගාවලිය 2023 හි තිළිණ හා සම්මාන ප්‍රදානෝත්සවය 2023 දෙසැම්බර් 28 මරදාන එල්පින්ස්ටන් රඟහලේ දී පැවැත්වුණි.

නූර්ති නාට්‍ය ජවනිකා, කෙටි නාට්‍ය, දිගු නාට්‍ය හා දෙමළ මාධ්‍ය කෙටි නාට්‍ය යන තරග අංශ යටතේ පැවැත්වූ මෙම තරගාවලියේ ජයග්‍රාහකයින් සඳහා පිරිනැමූ සමස්ත සම්මාන සංඛ්‍යාව 118 කි. ජයග්‍රාහකයින් සඳහා සහතික පත්, මුදල් ත්‍යාග, සම්මාන හා ජාතික තරගාවලිය නියෝජනය කළ පාසල් 38 සඳහාම පාසල් පුස්තකාලය සඳහා පොත් කට්ටලය බැගින් ද මෙදින ප්‍රදානය කෙරිණි.

මෙම සම්මාන උළෙල සඳහා රුපියල් ලක්ෂ 10 ක අනුග්‍රාහකත්වයක් නේෂන්ස් කැම්පස් ආයතනයෙන් දරනු ලැබූ අතර, රුපියල් ලක්ෂ 02 කට අධික මුදලක් වැය කරමින්, ජූරියේ විශේෂ ඇගයීම් සම්මාන සියල්ලම ශංකවි ෆිල්ම්ස් ආයතනයේ සභාපති දේශමාන්‍ය, ආචාර්ය දුරෙයිරාසා සුරේෂ් මහතා විසින් සකස් කර දෙන ලදී.

තවද ජාතික තරගාවලිය නියෝජනය කළ පාසල් 38 හි පුස්තකාල සඳහා පොත් කට්ටල ලබාදීම වෙනුවෙන් අනුග්‍රාහකත්වය දරනු ලැබුයේ, මධ්‍යම සංස්කෘතික අරමුදල, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා සමස්ත ලංකා හින්දු කොංග්‍රසයේ ලේකම් කෛලාසපුලෛම්මා මහත්මියයි. මීට අමතරව ටවර් හෝල් රඟහල පදනමේ ප්‍රකාශන කට්ටලය බැගින් ද ප්‍රදානය කෙරිණි.



සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගාවලියේ 29 වැනි තිළිණ හා සම්මාන ප්‍රදානෝත්සවය වර්ණවත් කිරීම සඳහා නර්තන දායකත්වය ලබාදෙන ලද්දේ, අගලවත්ත මිහිඳු මධ්‍ය මහා විද්‍යාලය, කොළඹ රාමනාදන් හින්දු විද්‍යාලය, අම්පාර බොරපොල මධ්‍ය මහා විද්‍යාලය, කොටහේන යහපත් එඬේරාගේ කන්‍යාරාමය හා සෙල්වරාණි මහත්මියගේ කලායතනය විසිනි.

මෙම සම්මාන උළෙලේ දී නූර්ති නාට්‍ය ජවනිකා අංශයෙන් හොඳම නිෂ්පාදනයට හිමි සම්මාන හා මුදල් ත්‍යාගය දිනාගනු ලැබූයේ මහනුවර විද්‍යාර්ථ විද්‍යාලය ඉදිරිපත් කළ ශ්‍රී වික්‍රම නූර්තියයි.

කෙටි නාට්‍ය අංශයේ හොඳම නිෂ්පාදනය කුරුණෑගල රෝයල් ජාත්‍යන්තර පාසල ඉදිරිපත් කළ භුස්ම නාට්‍යයට හිමි වූ අතර, දෙමළ මාධ්‍ය කෙටි නාට්‍ය අංශයේ හොඳම නිෂ්පාදනයට හිමි සම්මානය හා මුදල් ත්‍යාගය හිමිකරගන්නා ලද්දේ වවුනියාව හින්දු විද්‍යාලය ඉදිරිපත් කළ මුහන්කල් නාට්‍යයි.
එමෙන් ම මෙම සම්මාන උළෙලේදී දිගු නාට්‍ය අංශයේ හොඳම නිෂ්පානයට හිමි සම්මානය හා මුදල් ත්‍යාගය දිනාගනු ලැබූයේ අම්පාර බොරපොල මහා විද්‍යාලය ඉදිරිපත් කළ කොක් කොක් කොක් කොකැක් නාට්‍යයි.







පාසල් දූ දරුවන්ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සම්මාන උළෙල සඳහා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමා, ප්‍රවීණ රංගන ශිල්පිනී නදීකා ගුණසේකර මහත්මිය, ප්‍රවීණ රංගන ශිල්පී විල්සන් ගුණරත්න මහතා, ප්‍රවීණ රංගන ශිල්පී පාලිත සිල්වා මහතා, මහාචාර්ය එස්. මවුනගුරු මහතා හා විනිශ්චය මණ්ඩල සාමාජික මහත්ම මහත්මීන් ඇතුළු කලාකරුවන් විශාල සංඛ්‍යාවක් එක්වූ අතර, අයි.ඩී.එම්. නේෂන්ස් කැම්පස් ආයතනයේ සභාපති ආචාර්ය ලයනල් පින්තු මහතා, සංකවි ෆිල්ම්ස් ආයතනයේ සභාපති දේශමාන්‍ය ආචාර්ය දුරෙයිරාසා සුරේෂ් මහතා, මාලා සභාරත්නම් මහත්මිය, සමස්ත ලංකා හින්දු කොංග්‍රසයේ ලේකම් කෛලාසපුලෙම්මා මහත්මිය, වරණ ටී.වී. ආයතනයේ විධායක නිලධාරී රුචිර වීරකෝන් මහතා, තිනකරන් පුවත්පතේ කතෘ සෙන්දිල්වේලවර් මහතා හා වීරකේසරී පුවත්පතේ කතෘ ශ්‍රී ගජන් යන මහත්ම මහත්මීන් සහභාගී විය.

තවද මෙම අවස්ථාව සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ඒකකයේ අධ්‍යක්ෂ වරුණ අලහකෝන් මහතා, රාජ්‍ය නාට්‍ය උපදේශක සභාවේ සාමාජික චන්ද්‍රසිරි බෝගමුව මහතා, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ පීඨාධිපතිනි ආචාර්ය ඩී.වී.එම්. ද සිල්වා මහත්මිය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) කේ.ඒ.ඩී.ආර්. නිශාන්ති ජයසිංහ මහත්මිය, එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) එස්.ජී. පල්ලියගුරුගේ මහත්මිය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සෝමරත්න විදානපතිරණ මහතා ඇතුළු නිලධාරීන් විශාල සංඛ්‍යාවක් හා ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක මහතා ද එක්විය.



## සිංහල මාධ්‍ය නාට්‍ය හා රංගකලා පාසල

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය සමග අවබෝධතා ගිවිසුමකින් ඇති කර ගත් එකඟතාවය මත මෙම පාඨමාලාව ක්‍රියාත්මක වන අතර, නාට්‍ය හා රංගකලාව පිළිබඳ දෙවර්ෂ පූර්ණකාලීන උසස් ඩිප්ලෝමාව (SLQF) 3 හා (SLQF) 4) ලබා ගන්නා සිසුන් ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ ද්විතියික හා තෘතියික අධ්‍යාපන අධ්‍යායනාංශය මෙහෙයවන අධ්‍යාපනවේදී ( නාට්‍ය හා රංගකලා) උපාධි පාඨමාලාවේ අවසන් වර්ෂ දෙක එනම් (SLQF) 5 හා (SLQF) 6 මට්ටම් සඳහා යොමු කෙරේ.

පාඨමාලාවට ඇතුළත් වීම සඳහා තිබිය යුතු සුදුසුකම් :-

(අ) සෞන්දර්ය හා සිංහල විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ හා ගණිතය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් සහිතව සම්මාන 03 ක් සමගින් විෂයන් 06 කින් අ.පො.ස(සා.පෙළ) විභාගය සමත්ව තිබිය යුතුය.(මෙම සුදුසුකම් එක් සහතිකයකින් ඉදිරිපත් කළ හැකි විය යුතුයි)

(ආ) අ.පො.ස(උ.පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් එකවර සමත්වීම

(ඇ) මෙම පාඨමාලාවට සිසුන් තෝරා ගැනීමේදී අ.පො.ස(උ.පෙළ) සඳහා නාට්‍ය හා රංගකලාව විෂයක් ලෙස හදාරා ඇති සිසුන්ට පුමුඛතාවය ලබා දීම සලකා බලනු ලැබේ.

(ඉ) වයස අවුරුදු 18 ට නොඅඩු හා 25 ට නොවැඩි අවිවාහක අය විය යුතුය.

2023 වර්ෂයේදී නාට්‍ය පාසලේ අධ්‍යයන වර්ෂ තුනක සිසුන් අධ්‍යාපනය කටයුතු සිදු කරනු ලැබූහ. එනම් අධ්‍යයන වර්ෂ 2020/21 ,2021 /22, 2022/23

2020/21 – සිසුන් 44

2021/22 - සිසුන් 47

2022/23 - සිසුන් 65

❖ 2022/23 අධ්‍යයන වර්ෂය සඳහා නවක සිසුන් බඳවා ගැනීමට අදාළ විභාග නිවේදනය 2023 ජනවාරි මාසයේ 11 බදාදා දිවයින පුවත්පතේ, 2023 ජනවාරි 11 බදාදා ලංකාදීප පුවත්පත් වල පළ කරන ලදී.
2023 පෙබරවාරි 08 දින අයදුම්පත් බාර ගැනීමේ අවසාන දිනය වශයෙන් නම් කළ අතර, මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් 148 දෙනා 2023-03-28 - 2023-04-02 දින දක්වා සුදුසුකම්

පරීක්ෂා කිරීමේ හා ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවා ඉන් වැඩිම ලකුණු ලබා ගත් සිසුන් 66 දෙනෙකු පාඨමාලාව සඳහා තෝරා ගන්නා ලදී.

❖ පරීක්ෂණ මණ්ඩලය සඳහා සම්මානිත මහාචාර්ය ලයනල් බෙන්තරගේ , නාට්‍ය පාසලේ බාහිර දේශක තරංගා කුමාරි මහත්මිය කළමනාකරණ මණ්ඩල සාමාජික මහාචාර්ය අනුර වික්‍රමසිංහ මහතාත්, ටවර් හෝල් රඟහල පදනම නියෝජනය කරමින් සහකාර අධ්‍යක්ෂ(දෙමළ නාට්‍ය ප්‍රවර්ධන) ෂම්මුගම් ෂර්මා ජයප්‍රකාශ් යන මහතුන් සහභාගි වූහ.

ඒ අනුව 2022/23 අධ්‍යයන වර්ෂයට නවක සිසුන් බඳවා ගැනීමේ සමාරම්භක උත්සවය 2023 ජුනි දින සවිසිරිපාය ශ්‍රවණාගාරයේදී බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමා ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසකගේ සහභාගීත්වයෙන් පැවැත්වුණි.

❖ නවක සිසුන් දිශාභිමුඛ කිරීමේ කටයුතු 2023-06-20 දින සිට 23 දින දක්වා පැවතුණු අතර, ඉන් අනතුරුව 26 දින සිට ප්‍රථම අධ්‍යයන වර්ෂ ප්‍රථම අධ්‍යයන වාරයේ අධ්‍යයන කටයුතු ආරම්භ විය.

❖ දිශාභිමුඛ කිරීමේ වැඩසටහනේදී ශ්‍රී ලංකා පොලිසියේ හා අන්තරායක ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිලධාරීන් සම්බන්ධ කර ගනිමින් සිසුන්ට වර්තමානයේ බොහෝ විට සිදුවන හිංසන හා අනතුරු සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කරන ලදී. එමෙන්ම විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා උපාධි පාඨමාලාවේ සම්බන්ධීකාරක ආචාර්ය අයෝමි ඉරුගල් බණ්ඩාර මහත්මියත්, කළමනාකරණ මණ්ඩලයේ සාමාජික මහාචාර්ය අනුර වික්‍රමසිංහ යන මහතුන් ද සම්බන්ධ කරමින් අවශ්‍ය දැනුම හා අවබෝධය සිසුන් වෙත ලබා දීමට කටයුතු කරන ලදී. එමෙන්ම සිසුන්ට ප්‍රායෝගික පරිචය සම්බන්ධයෙන් වන දැනුම ප්‍රවීන රංගන ශිල්පී පාලිත සිල්වා මහතා විසිනුත් ලබා දෙන ලදී.



දේශන කටයුතු හා විභාග පැවැත්වීම

1 අධ්‍යයන වර්ෂ 2020/21 සිසුන්ගේ දෙවන අධ්‍යයන වර්ෂ ප්‍රථම හා දෙවන අධ්‍යයන වාරයන්හි දේශන හා ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු පවත්වන ලදී ( ජන- ජුලි)

2 අධ්‍යයන වර්ෂ 2021/22 සිසුන්ගේ ප්‍රථම අධ්‍යයන වර්ෂ ප්‍රථම හා දෙවන අධ්‍යයන වාරයන්හි දේශන හා ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු පවත්වන ලදී ( මාර්තු- දෙසැම්බර්)

3 අධ්‍යයන වර්ෂ 2022/23 සිසුන්ගේ අධ්‍යයන වර්ෂයේ ප්‍රථම අධ්‍යයන වර්ෂ ප්‍රථම අධ්‍යයන වාර දේශන කටයුතු පවත්වන ලදී. (ජුනි - දෙසැම්බර්)

❖ 2020/21 අධ්‍යයන වර්ෂයේ සිසුන්ගේ අවසාන ප්‍රායෝගික  පරීක්ෂණය සැප්තැම්බර් 11-12 දිනයන්හි එල්ෆින්ස්ටන් රඟහලේදී පවත්වන ලදී. ඒ අනුව  නාට්‍ය 06 ක් වේදිකා ගත කරන ලදී. එහිදි සිසුන් නාට්‍ය අධ්‍යක්ෂණය, නිෂ්පාදනය, රංගාලෝක ,නාට්‍ය සංගීත, වේදිකා පරිපාලනය ආදි ආනුෂංගික කලාවන් සම්බන්ධයෙන් තමන් ප්‍රගුණ කළ දැනුම පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ ඉදිරිපත් කරන ලදී. පරීක්ෂණ මණ්ඩලය වශයෙන් ප්‍රසන්නජිත් අබේසූරිය, උෂාන් පෙරේරා,පී.ප්‍රදීප් චන්ද්‍රසිරි යන මහතුන් සහභාගී වූහ.

❖ අධ්‍යයන වර්ෂ 2020/21 සිසුන් 34 දෙනෙකු සඳහා ඩිප්ලෝමා සහතික ප්‍රදානය කිරීමේ උත්සවය 2023 ඔක්තෝබර් 05 දින ගරු බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍යතුමාගේ හා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අංශාධිපති මහාචාර්ය ශාමේන්ද්‍ර වනසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන්  සච්සිරිපාය ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

❖ අමාත්‍යාංශය නියෝජනය කරමින් බුද්ධ ශාසන,ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සෝමරත්න විදානපතිරණ මහතා, අතිරේක ලේකම් (සංවර්ධන) කේ ඒ ඩී ආර් නිශාන්ති ජයසිංහ මහත්මිය, අතිරේක ලේකම්(පාලන) එස් ජී පල්ලියගුරුගේ යන මහත්ම මහත්මීන් සහභාගී වූහ.

❖ නාට්‍ය හා රංගකලා පාසලේ අධ්‍යයන කළමනාකරණ මණ්ඩල සාමාජික සම්මානිත මහාචාර්ය ගාමිණී දැල බණ්ඩාර, මහාචාර්ය ටියුඩර් වීරසිංහ,මහාචාර්ය අනුර වික්‍රමසිංහ, හා නාට්‍ය පාසලේ දේශක මහතුන් මෙන්ම වර්තමාන නාට්‍ය පාසල් සිසු සිසුවියන්, ඩිප්ලෝමාලාභී සිසුන්ගේ දෙමාපියන් ඇතුළු ටවර් හෝල් රඟහල පදනමේ කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකයින් සහභාගී වූහ.



❖ මෙම උත්සවයේ මුඛ්‍ය දේශනය පවත්වනු ලැබුයේ ජාතික කලා මණ්ඩලයේ සභාපති මහාචාර්ය ප්‍රණීත් අබේසුන්දර මහතා විසිනි.



මෙහිදි  අධ්‍යයන වර්ෂයේ විශේෂ දක්ෂතා ප්‍රගුණ කළ සිසු සිසුවියන් 05 දෙනෙක් සඳහා පිළිවෙලින් සී දොන් බස්තියන් ජයවීර බණ්ඩාර අනුස්මරණ පදක්කම මහීපාල මුදලිගේ සිතුමි විහාරා සිසුවියත්, නීතිඥ ජෝන් ද සිල්වා අනුස්මරණ පදක්කම ගීතානි භාග්‍යා අමරසිංහ සිසුවියත්, නීතිඥ චාල්ස් ඩයස් අනුස්මරණ පදක්කම දුලාංජලී පවිත්‍රා ද සිල්වා සිසුවියත්, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර අනුස්මරණ පදක්කම චමෝදි ජයනන්දිමා සචිනි ප්‍රේමරත්න සිසුවියත්, වසරේ දක්ෂතම සිසුවිය ලෙද නතාෂා ගයත්‍රී සිසුවියත් පදක්කම හිමි කර ගන්නා ලදී.





- ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2023-10-11 දින රැස් වූ ටවර් හෝල් රඟහල පදනමේ භාරකාර මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණයකට අනුව නාට්‍ය පාසලේ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයේ පදක්කම්ලාභී සිසු සිසුවියන් 05 දෙනා වෙනුවෙන් රුපියල් 50,000/- ක වටිනාකමින් යුත් ශිෂ්‍යත්වයක් ලබා දීමට තීරණය කරනු ලැබීය. එම තීරණය ක්‍රියාත්මක කරමින් 2023-11-22 දින සච්සිරිපායේදී ගරු අමාත්‍ය විදුර වික්‍රමනායක මැතිතුමාගේ සුරතින් අදාළ සිසුවියන් වෙත ශිෂ්‍යත්ව මුදල් ප්‍රදානය කරන ලදී.



- 2023 ලෝක නාට්‍ය උළෙලට සමගාමීව ජාත්‍යන්තර නාට්‍ය හා රංගකලා ආයතනයේ ශ්‍රී ලංකා නියෝජිත වන ටවර් හෝල් රඟහල පදනම මාර්තු 27 දින ලෝක නාට්‍ය දින සැමරුම් උත්සවයක් සංවිධානය කරන ලදී.

- සිංහල මාධ්‍ය නාට්‍ය පාසල් සිසුන් හා යාපනය දෙමළ මාධ්‍ය නාට්‍ය පාසලේ සිසු සිසුවියන්ගේ එකතුවෙන් මෙම උත්සවය සඳහා Next Up නාට්‍යය නිෂ්පාදනය කර වේදිකාගත කරන ලදී. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ජාතීන් අතර එකතුවෙන් එකම වේදිකාවක මෙම නාට්‍යයේ මංගල දර්ශනය වේදිකා ගත කිරීම නාට්‍ය පාසල ලැබූ විශිෂ්ඨ ජයග්‍රහනයකි.








❖ 2023 ඔක්තෝබර් 10 දින 2020/21 අධ්‍යයන වර්ෂයේ ඩිප්ලෝමාලාභී සිසුන් 34 දෙනාගේ නාම ලේඛණය විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා ලියාපදිංචි කිරීම වෙනුවෙන් යවන ලදී.



## දෙමළ මාධ්‍ය නාට්‍ය හා රංගකලා පාසල

❖ 2022.12.25 දින 2023/2024 වර්ෂයේ දෙමළ මාධ්‍ය නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් බඳවා ගැනීමට අදාළ තොරතුරු පත්‍රිකාව 2022.12.25 දින උදයම් හා වීරකේශරි පුවත්පත්වල පළ කිරීමට අදාළ කටයුතු සිදු කර ඇත. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2023/01/31.

❖ 2023/01/05 දින නර්තනය හා සංගීත විෂයභාර ගුරුවහවතුන් විසින් විෂය බාහිර ක්‍රියාකාරකමක් ලෙස යාපනය මාදගල් කෝවිලේ පැවති ආගමික උත්සවය සඳහා 2022/23 සිසුන් සහභාගී වුහ.





❖ 2023/1/10 දින හා 2023/01/17 දිනවල යාපනය යෝග ගුරුවරු එස්. උමා සුදන් මහතා විසින් යෝගා පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

❖ 2023/01/11 දින 2022/23 ප්‍රථම අධ්‍යයන වර්ෂයේ දෙවන වාර පරීක්ෂණයට අදාළ කටයුතු ආරම්භ කර ඇත.



- ❖ 2023/01/12 හා 13 දිනවල ඉන්දියානු සංස්කෘත රඟහල(Indian Sanskrit theatre) විෂය අදාළ සාකුන්තලම් නාට්‍ය නර්තනය ප්‍රදර්ශනය කරන ලදී.



- ❖ 2023/01/19 දින පළමු අධ්‍යයන වර්ෂයේ දෙවන වාර පරීක්ෂණයට අදාළ විභාග ප්‍රවේශපත්‍ර සිසුන් වෙත නිකුත් කර ඇත.

- ❖ 2023/01/21 දින චුලිපුරම් පැවැත්වූ උත්සවය සඳහා නාට්‍ය පාසල සිසුන් සහභාගී වූහ.

- ❖ 2023 ජනවාරි මස 29 දින සිට පෙබරවාරි 03 වෙන දින දක්වා පළමු අධ්‍යයන වර්ෂයේ දෙවන වාර පරීක්ෂණය සිදුවිය.



- ❖ මාර්තු මස 14,15,16,17 හා 18 දිනවල යාපනය වංකානෙ සංස්කෘතික මධ්‍යස්ථානයේ දී දෙමළ නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමා පාඨමාලව සඳහා සිසුන් 90 දෙනෙක් සඳහා සම්මුඛ පරීක්ෂණය පැවත්වීය. එම සම්මුඛ පරීක්ෂක මණ්ඩලය ලෙස කේ.කන්දවේල් මහතා, අරුණාසලම් සංමුගදාස් මහතා හා ෂංමුග ෂර්මා ජයප්‍රකාශ් මහතා සහභාගී වී ඇත. ලකුණු කුසලතා මඟින් සිසුන් 70 දෙනෙක් තෝරාගෙන ඇත.



- ❖ මාර්තු මස 21,22 දිනවල පළමු අධ්‍යයන වර්ෂ දෙවන වාර පරීක්ෂණයට අදාළ ප්‍රායෝගික පරීක්ෂණය (රංගන) පැවත්වීය.

- ❖ මාර්තු මස 20 දින 2023 වර්ෂයට අදාළ ප්‍රථම කළමනාකරණ රැස්වීම උතුරු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේදී පැවත්වුණි.

- ❖ මාර්තු 27 ලෝක නාට්‍ය දින සැමරුම් උත්සවයට සහභාගී විය.

- නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමා පාඨමාලාව( දෙමළ මාධ්‍ය) සඳහා සිසුන් බඳවා ගැනීමේ උත්සවය යාපනය වංකානෙ සංස්කෘතික මධ්‍යස්ථානයේ දී අප්‍රේල් මස 28 දින පැවැත්වුණි. 2023/2024 යන අධ්‍යයන වර්ෂයන් සඳහා මෙහිදී සිසුන් බඳවා ගැනීම සිදු කළ අතර දෙවර්ෂ පූර්ණ කාලීන පාඨමාලාවක් ලෙස අධ්‍යන කටයුතු සිදු කෙරේ.මෙම පාඨමාලාව සඳහා සිසුන් 60 දෙනක් පෙනී සිටියහ.



- එම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යයන පීඨයේ ද්විතීයික හා තෘතීයික අධ්‍යනාංශයේ අංශාධිපති මහාචාර්ය ඩබ්.එම්.එස්. වනසිංහ මහතා, උතුරු නැගෙනහිර පළාත් සභාවේ සංස්කෘතික අධ්‍යක්ෂිකා රාජ මල්ලිගෛ මහත්මිය, යාපනය විශ්වවිද්‍යාලයේ හිටපු මහාචාර්ය ෂම්මුගදාස් මහතා, ටවර් දෙමළ නාට්‍ය පාසලේ අධ්‍යන කළමනාකරණ මණ්ඩලයේ සාමාජික සාමාජිකාවන්, ටවර් හෝල් රඟහල පදනම අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක මහතා, ටවර් හෝල් රඟහල පදනම අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන) නිපුන දිසානායක මහතා, දෙමළ මාධය නාට්‍ය පාසලේ ප්‍රධානී මෙන්ම ටවර් හෝල් රඟහල පදනමේ දෙමළ නාට්‍ය ප්‍රවර්ධන අංශයේ සහකාර අධ්‍යක්ෂ ෂංමුග ශර්මා ජයප්‍රකාෂ් මහතා ඇතුළු ටවර් හෝල් රඟහල පදනම නිලධාරීන්, නාට්‍ය පාසල් දරු දැරියන්ගේ දෙමව්පියන් ඇතුළු විශාල පිරිසක් මෙම අවස්ථාවට සහභාගී විය.



- ටවර් හෝල් රඟහල පදනම අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ප්‍රධානත්වයෙන් උත්සවයේ කටයුතු ආරම්භ කළ අතර, මෙහි මුඛ්‍ය දේශන සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ ද්විතීයික හා තෘතීයික අධ්‍යනාංශයේ අංශාධිපති මහාචාර්ය ඩබ්.එම්.එස්.වනසිංහ මහතා, යාපනය විවෘත විශ්වවිද්‍යාලයේ සහකාර අධ්‍යක්ෂ කේ. කන්දවෙල් මහතා, උතුරු පලාත් සංස්කෘතික සහකාර අධ්‍යක්ෂ රාජමල්ලිකෛ සිවසුන්දර ෂර්මා මහත්මීය හා ෂංමුගදාස් මහතා සිදු කළේය.



❖ 2023.05.02 දින සිට 2023.05.03 දින දක්වා සංස්කෘතික මධ්‍යස්ථානයේදී දිශාභිමුඛ වැඩසටහන් පවත්වන ලදි .එහිදි සම්පත්දායක ලෙස අයුරන් මහතා හා අරවින්ත් මහතා , සම්පත්දායක සහායක ලෙස ලදූර්ෂන් මහතා හා සිවා මහතා විසින් නාට්‍ය පාසල සිසු/සිසුවියන් සඳහා ප්‍රායෝගික වැඩමුළු පවත්වන ලදී.

❖ 2023 අගොස්තු මස 15 සිට 20 දක්වා 2022/23 අධ්‍යයන වර්ෂ දෙවන අධ්‍යයන වර්ෂයේ පළමු වාර පරීක්ෂණය සිදුවිය.

❖ සැප්තැම්බර් මස 11 සිට 15 වෙනි දින දක්වා නාට්‍ය පාසලේ සිසුන් වෙනුවෙන් උඩරට නැටුම් විෂයට අදාළ ප්‍රායෝගික වැඩමුළු මාලාව පැවැත්වීය. මෙහි සම්පත්දායකත්වය දරණ ලද්දේ ලහිරු රොශාන් මහතා (visual arts & Performing University of Colombo lecturer)විසිනි මෙම වැඩමුළු සඳහා නාට්‍ය පාසලේ සිසු සිසුවියන් 57 සහභාගී වීය.

❖ ඔක්තෝම්බර් මස වංකානෙන හා සංදිලිපායි නාට්‍ය පාසලේ වාර්ෂික සරස්වති පූජාව පවත්වන ලදී.



## යාපනය වවර් දෙමළ නාටය උලෙළ

❖ ඔක්තෝම්බර් මස 24, 25 හා 26 දිනවල අපේක්ෂා දෙමළ නාටය උලේළ යාපනය යුනියන් විද්‍යාලයේදි දී පැවත්වුණි. දින 03 ක් උදේ 9 සිට 12.30 දක්වා නිට්‍ය ප්‍රදර්ශනය කරන ලදී. මෙහිදි නාට්‍ය 11 ක් ප්‍රදර්ශනය කරන ලදී. වවර් නාට්‍ය පාසල සිසු සිසුවියන්ගේ නාට්‍ය ද මෙහිදි ප්‍රදර්ශනය කර ඇත. නාට්‍ය හා රංගකලාව හදාරන පාසල් සිසු සිසුවියන් ගුරුභවතුන් මේ සඳහා සහභාගී විය. මෙහිදී එස්. රාගවේන්ද්‍රන් මහතා විසින් අධ්‍යක්ෂනය කළ ඉසයි නාඩහ පාඩල්ගලෙ කාඩිසිපපටුත්තල් නාට්‍ය ද, කාතවරායන් කූත්තු නාට්‍ය ද, පී. ගනේෂරාසා මහතා විසින් අධ්‍යක්ෂනය කළ එන්නවෙන්රු සොල්වේනඩි, තලෙ එලුත්තු හා කාදලුක්කු මරුන්දු නාට්‍ය වේදිකාගත කෙරුණි.මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස උතුරු පළාත් ප්‍රධාන ලේකම්, සමන් බන්දුලසේන මහතා, උතුරු පළාත් අධ්‍යාපන ලේකම්, පැට්‍රික් ඩිරංජන් මහතා, උතුරු පළාත් නියෝජ්‍ය පොලිස්පති මහින්ද ගුණරත්න මහතා ඇතුළු විශාල පිරිසක් සහභාගී විය.





- ❖ ඔක්තෝම්බර් 26 දින බජොන්සන් රාජ්කුමාර් මහතා විසින් අධ්‍යක්ෂනය කළ ළමා නාට්‍ය හා ටී. අයූරන් මහතා විසින් අධ්‍යක්ෂනය කළ අරිචන්තිර මයාන කාණ්ඩම් නාට්‍ය ප්‍රදර්ශනය කර ඇත, නාට්‍ය උළෙලේ අවසන් දිනය වන ඔක්තෝම්බර් 27 ටී. අයූරන් මහතා විසින් අධ්‍යක්ෂනය කළ උරයින්ද පූලරි කෙටි නාට්‍ය හා වේදාලම් නාට්‍යක් ප්‍රදර්ශනය කෙරිණි.



- ❖ නොවැම්බර් මස 20සිට 27දින දක්වා 24/2023අධ්‍යන වර්ෂ ප්‍රථම අධ්‍යන වාරයේ පළමු වාර පරීක්ෂණය සිදුවිය .නොවැම්බර් මස 28 සිට දෙසැම්බර් මස 01දින දක්වා ප්‍රායෝගික පරීක්ෂණය හා අධ්‍යන වර්ෂ 23/2022 දෙවන අධ්‍යන වර්ෂයේ දෙවන වාර ප්‍රායෝගික පරීක්ෂණය සිදුවිය.

## අභියෝග

- ❖ ටවර් හෝල් රඟහල පදනම සතු ටවර් හා එල්ෆින්ස්ටන් රඟහල වසර 100 ට වඩා පැරණි බැවින් එවා නඩත්තු කර පවත්වාගෙන යාම සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වීම.

- ❖ පවතින ආර්ථික ගැටළු මත නිෂ්පාදකයින් කලා කටයුතු සඳහා සිදුකරන ආයෝජනය අඩු වීම.

- ❖ නූතන තාක්ෂණය හා සංස්කෘතිය වේගයෙන් වෙනස් වීම මත වේදිකා නාට්‍ය කෙරෙහි ඇති ඇල්ම මිනිසුන්ගෙන් ඈත්වීම.

## ඉදිරි ඉලක්ක

- ❖ වේදිකා නාට්‍ය ඇතුළු ප්‍රාසාංගික කලාවන්හි නියැලෙන්නන් ඇගයීම හා ඔවුන්ගේ සුභසාධන කටයුතු ඉහළ නැංවීම.
- ❖ නාඩගම්,නූර්ති,ටීටර් යුගයේ නිර්මාණ රසාස්වාදය වෙනුවෙන් අනාගත පරපුරට දායාද කිරීම.

- ❖ ගුණාත්මක නාට්‍ය හා ප්‍රාසාංගික කලා නිර්මාණ බිහිකිරීමට නිර්මාණවේදීන් පෙළඹවීම.

- ❖ දේශීය නාට්‍ය හා ප්‍රාසාංගික කලාවන් ජාත්‍යාන්තරයට හා ජාත්‍යාන්තර ප්‍රවණතා දේශීය නාට්‍ය හා ප්‍රාසාංගික කලාවන්ට හඳුන්වා දීම,පුළුල් කිරීම.
- ❖ ටවර් හෝල් රඟහල පදනම සතු රංගශාලා හා ශබ්දාගාරය සංවර්ධනය කර දෙස් විදෙස් ජනතාව අතර ප්‍රචලිත කිරීම.
- ❖ නාට්‍ය ඇතුළු ප්‍රාසාංගික කලාවන්හී ගුණාත්මක සංස්කෘතියක් බිහිකිරීම හා ප්‍රවර්ධනය කිරීම.

ආචාර්ය ඩී.එම්.එස්.දිසානායක
අධ්‍යක්ෂ ජනරාල්
ටවර් හෝල් රඟහල පදනම

# පරිච්ඡේදය 03

## වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

**3.1 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| | සටහන් | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|---|
| ආදායම | | | |
| **එකතු කළා:** | | | |
| රජයෙන් ලද ප්‍රදාන - පුනරාවර්තන වියදම් | | 59,090,000 | 62,595,000 |
| මෙහෙයුම් ආදායම | **1** | 44,101,265 | 18,807,506 |
| පොලී සහ වෙනත් ආදායම් | **2** | 44,782,335 | 22,865,217 |
| වැඩසටහන් ආදායම | **2** | 16,074,475 | 10,055,375 |
| | | 164,048,075 | 114,323,098 |
| වියදම් | | | |
| **අඩු කළා:** | | | |
| පරිපාලන සහ ආයතනික වියදම් | **3** | 197,934,917 | 174,873,034 |
| ප්‍රවර්ධන සහ සුබසාධන වියදම් | **4** | 29,556,428 | 20,183,111 |
| මූල්‍ය සහ වෙනත් වියදම් | **5** | 80,026 | 59,835 |
| | | 227,571,371 | 195,115,980 |
| ආදායම ඉක්මවූ වියදම | | **(63,523,296)** | **(80,792,883)** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | |
| ක්‍රමක්ෂය | | **48,679,055** | - |
| ආදායම ඉක්මවූ වියදම | | **(14,844,240)** | - |

**3.2 මූල්‍ය තත්වය පිලිබඳ ප්‍රකාශනය**

| | සටහන් | 2023<br>රු. | 2022<br>රු. |
|---|---|---|---|
| වත්කම් | | | |
| **ජංගම වත්කම්** | | | |
| අතේ ඇති මුදල් සහ බැංකු ශේෂය | **6** | 11,437,498 | 10,744,583 |
| තොග | **9** | 3,795,670 | 2,706,926 |
| තැන්පතු | **7** | 158,000 | 158,000 |
| පෙරගෙවුම් | **7** | 967,408 | 872,156 |
| වසරක් ඇතුළත ලැබිය හැකි ආපදා ණය | **7** | 2,694,240 | 2,851,208 |
| අත්තිකාරම් | **7** | 2,874,931 | 7,445,191 |
| ණය ගැතියන් | **8** | 11,286,042 | 4,513,400 |
| ලැබිය යුතු වෙනත් දෑ | **8** | 345,152 | 423,914 |
| ආයෝජන - THT සහ TRT | **10** | 128,200,000 | 135,568,211 |
| ආයෝජන - PWF | **10** | 72,600,000 | 70,999,700 |
| **මුළු ජංගම වත්කම්** | | **234,358,942** | **236,283,288** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත සහ උපකරණ | **11** | 1,374,828,640 | 1,518,531,327 |
| දීර්ඝ කාලීන ආයෝජනය - THT | **10** | 20,000,000 | - |
| දීර්ඝ කාලීන ආයෝජනය - PWF | **10** | 8,200,000 | - |
| ලැබිය යුතු ආපදා ණය (වසරකට පසු) | **7** | 7,390,575 | 2,579,218 |
| **ජංගම නොවන මුළු වත්කම්**<br>- | | **1,410,419,215** | **1,521,110,546** |
| **මුළු වත්කම්** | | **1,644,778,157** | **1,757,393,834** |
| බැරකම් | | | |
| **ජංගම බැරකම්** | | | |
| ණයහිමියන් සහ උපචිත වියදම් | **12** | 15,787,503 | 14,328,505 |
| අත්තිකාරම් වශයෙන් ලැබුණු මුදල් | **13** | 7,703,670 | 1,631,015 |

| | | | |
|---|---|---|---|
| ආපසු ගෙවීමට ඇති තැන්පතු | **14** | 2,594,400 | 2,005,300 |
| **මුළු ජංගම බැරකම්** | | **26,085,573** | **17,964,820** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| පාරිතෝෂිකය සඳහා වෙන්කිරීම් | | 24,184,697 | 23,196,800 |
| **මුළු ජංගම නොවන බැරකම්** | | **24,184,697** | **23,196,800** |
| **සම්පූර්ණ බැරකම්** | | **50,270,270** | **41,161,620** |
| **ශුද්ධ වත්කම්** | | **1,594,507,887** | **1,716,232,214** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධ** | | | |
| සමුච්චිත අරමුදල | **15** | (4,423,359) | 96,347,725 |
| **සංචිත** | | | |
| රජයේ ප්‍රදානය | | 1,000,000 | 1,000,000 |
| රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදානය | | 219,642,366 | 260,307,909 |
| ජනාධිපති සුබසාධන අරමුදල | | 80,800,000 | 60,399,700 |
| මුදල් පරිත්‍යාග | | 18,577,319 | 18,577,319 |
| පරිත්‍යාග | | 58,890,541 | 58,890,541 |
| වාහන පරිත්‍යාග | | 2,275,000 | 2,975,000 |
| රුක්මණී දේවි අරමුදල | | 21,176 | 21,176 |
| වත්කම් ප්‍රත්‍යාගණනය | **16** | 1,216,450,453 | 1,216,450,453 |
| නාට්‍ය සහ රංගකලා ශිෂ්‍යත්ව අරමුදල | | 394,828 | 382,828 |
| ශිෂ්‍යත්ව අරමුදල | | 602,665 | 602,665 |
| ටවර් වෘත්තියාභිමුඛ සංසදය | | 276,900 | 276,900 |
| **මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධ** | | **1,594,507,887** | **1,716,232,214** |

The notes appearing on pages 12 to 25 form an integral part of the financial statements.
The Members of the Tower Hall Theatre Foundation are responsible for the preparation and presentation of these financial statements.
For and on behalf of the Members of the Board.

| S K Deshappriya<br>Assistant Director (Finance) | Dr. D M S Dissanayake<br>Director General | Member of the<br>Board of Trustee | Member of the<br>Board of Trustee |
|---|---|---|---|

### 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය**

| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ | **2023**<br>(රු.) | **2022**<br>(රු.) |
|---|---|---|
| ආදායම ඉක්මවූ වියදමේ ප්‍රමාණය | (63,523,296) | (80,792,883) |
| එකතු කළා: පෙර වසර සඳහා ගැලපීම | (65,526,544) | (1,858,699) |
| **ගැලපුම් කළ ආදායම ඉක්මවූ වියදමේ ප්‍රමාණය** | **(129,049,840)** | **(82,651,582)** |
| <u>ගැලපීම</u> | - | |
| බැහැර කිරීමේ වත්කම්වල ලාභය/වත්කම් නැවත තක්සේරු කිරීම | - | 34,670,000 |
| ක්ෂය වීම | 96,486,261 | 93,695,382 |
| ශේෂය කපා හැරීම | - | - |
| පොලී ආදායම | (43,833,685) | (22,339,717) |
| පරිත්‍යාග සහ ප්‍රාග්ධන ආධාර ලෙස ලද වාහන | (700,000) | 2,975,000 |
| වසර සඳහා විවිධ ආදායම් | - | (1,100,620) |
| පාරිතෝෂිතය | 1,961,380 | 1,495,155 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මුදල් ප්‍රවාහ ක්‍රියාත්මක කිරීම** | **(75,135,884)** | **26,743,619** |
| තොග (වැඩිවීම) /අඩුවීම | (1,088,744) | 9,027 |
| ණය ගැතියන් සහ අනෙකුත් ලැබිය යුතු මුදල් (වැඩිවීම)/අඩුවීම | (6,693,880) | (1,801,565) |
| තැන්පතු, පෙරගෙවුම් සහ අත්තිකාරම්වල (වැඩිවීම)/අඩුවීම | (95,252) | (445,150) |
i. මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ රු.14,844,240 ක් වූ ඌනතාවය රු.63,523,296 ක් ලෙස රු.48,679,056 ක් වැඩියෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුළත් කර තිබුණු අතර වර්ෂය සඳහා වූ රු.96,486,261 ක ක්ෂය වියදම් රු.96,533,261 ක් ලෙස රු.47,000 කින් වැඩියෙන් දැක්වීමත්, වර්ෂය තුළ ගෙවූ රු. 1,216,143 ක පාරිතෝෂික වටිනාකම, රු. 973,483 ක් ලෙස රු. 242,660 ක් අඩුවෙන් දැක්වීමත් හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහය නිවැරදි නොවන බවට නිරීක්ෂණය විය.

ii. සමාලෝචිත වර්ෂය තුල මුදලින් ලද රු.41,480,317 ක් වූ ආයෝජන පොලිය රු.43,833,685 ක් ලෙස රු. 2,353,368 ක් වැඩියෙන් ද, රු.34,220,807 ක ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් රු.47,169,426 ක් ලෙස රු.12,948,619 ක් වැඩියෙන් ද දැක්වීමෙන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහය නිවැරදි නොවන බවට නිරීක්ෂණය විය.

iii. ප්‍රමිතයේ 09 ඡේදය ප්‍රකාරව අත්පත් කරගත් දිනයේ සිට කල්පිරීමට ඉතිරිව ඇති කාලය මාස 03 හෝ ඊට අඩු ආයෝජන, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හා මුදල් හා සමාන දෑ ද්‍රවශීල වත්කම් ලෙස පෙන්නුම් කළයුතු වුවද, මාස තුනකින් කල්පිරීමට නියමිත රු. 22,000,000 ක් වූ ස්ථාවර තැන්පතු 03 ක වටිනාකම මුදල් හා සමාන දෑ ලෙස දක්වනු වෙනුවට ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 පදනමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් පදනමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනමේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය පදනම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව

ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පදනම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (ඇ) හා (උ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පදනමේ භාරකාර මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට පදනම සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ භාරකාර මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ල) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් **නිරීක්ෂණ** හැර පදනමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| බලතල, කර්තව්‍ය සහ කාර්යයන් | නිරීක්ෂණ |
| --- | --- |
| සවසිරිපාය ගොඩනැගිල්ල සහ එය පිහිටි භූමිභාගය පදනම වෙත පවරාදීමට අදාළ 1980 ඔක්තෝබර් 08 දිනැති විශේෂ දීමනා පත්‍රයේ නියමයන් | (අ) මෙම ඉඩම හා එහි පිහිටි ගොඩනැඟිලි ජාතික නාට්‍ය කටයුතු දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය කාර්යයන් සඳහා මිස වෙනත් කාර්යයන් සඳහා නොයෙදවිය යුතු බවත්, එම කාර්යයන් සඳහා යොදවා නොගන්නේ නම් නැවත රජය වෙත පැවරෙනු ඇති බවත් සඳහන් වී තිබුණ ද, පදනම සතු සවසිරිපාය ගොඩනැගිල්ල හා එය පිහිටි භූමිභාගය 1986 මැයි 15 දින සිට ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට අවස්ථා 02 කදී වසර 30 බැගින් බදු දී තිබුණු අතර විධිමත් අනුමැතියකින් තොරව දෙවන ගිවිසුමට එළඹ තිබුණි. 2016 මැයි 14 දින බදු කාල සීමාව අවසන් වීමෙන් පසුවද කුලී ගෙවීමකින් තොරව සහ 2023 ජනවාරි 04 දින අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදී හා 2024 ජනවාරි 30 දින අග්‍රාමාත්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේදී ගන්නා ලද තීරණ අනුව ගාස්තු ගෙවීමට, නව බදු ගිවිසුමකට එළඹීමට හෝ එම කාර්යාලය අධිකාරිය සතු ගොඩනැගිල්ලක වහාම ස්ථාපිත කිරීමට කටයුතු නොකර, ගොඩනැගිල්ලේ රැදී තිබුණි. |
| | (ආ) පදනම විසින් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සමඟ ඇති කරගත් මූලික බදු ගිවිසුමේ, බදු ගැනුම්කරුවන්ට සම්පූර්ණ බදු දේපළ හෝ ඉන් කොටසක් හෝ අතුරු බදු දීමට බලය ඇත්තේය, යනුවෙන් පදනමට අවාසි වන කොන්දේසියක් ඇතුළත් කිරීම හේතුවෙන් එම අධිකාරිය විසින් වර්ග අඩි 2017 ක වපසරියක් 2021 ජූලි 01 දින සිට 2023 ජුනි 30 දින දක්වා කාලපරිච්ඡේදය සඳහා රු. 227,000 ක මාසික කුලියකට ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල (CGF) වෙත අතුරු බදු දී තිබුණු අතර ශ්‍රවණාගාරයද කුලී පදනමට බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණි. |

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ළ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර පදනමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(අ) ටවර් රඟහලේ කොටසක් කෞතුකාගාරයක් ලෙස වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත රු.1.410.800 ක ඇස්තමේන්තුවකට 2023 දෙසැම්බර් 04 දින ලංසුව ප්‍රදානය කර මුළු ඇස්තමේන්තු මුදලින් සියයට 5 ක රඳවා ගැනීමේ මුදල අඩුකර රු. 1.340.260 ක මුදලම 2023 දෙසැම්බර් 29 දින අධිකාරිය වෙත ගෙවා තිබුණු අතර ප්‍රතිග්‍රහණ ලිපිය අනුව මෙම කාර්යය 2023 දෙසැම්බර් 31 දිනට පෙර නිම කළයුතු වුවත් විගණනය විසින් ස්ථානීය පරීක්ෂාව සිදුකරන ලද 2024 අප්‍රේල් 18 දින වන විටත් අදාළ කාර්යය නිම කර නොතිබුණි.

(ආ) මුල් ඇස්තමේන්තුව රු. 3.914.827 ක් වූ සරසවිපාය පිටුපස පිහිටි ගොඩනැගිල්ලේ අලුත්වැඩියාව තෙවන වර වැඩිකල ඇස්තමේන්තුව වූ රු. 7.219.643 කට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ප්‍රදානය කර තිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ඡේදයට පටහැනිව සියයට 30 ක අන්තිකාරම් සීමාව ඉක්මවා සියයට 89 ක් වූ රු.6.461.374 ක මුදලක් සුරක්ෂණයක් ලබා ගැනිමකින් තොරව ගෙවා තිබුණි. එහි කළවැඩ වටිනාකම රු.4.738.154 ක් වුයෙන් වැඩිපුර ගෙවූ රු.1.723.220 ක මුදල මාස 09 කට අධික කාලයක් ගතවීමෙන් පසු 2024 ජුලි මාසයේදී අයකර ගෙන තිබුණි.

## 2.3 වෙනත් කරුණු

(අ) 2023 දෙසැම්බර් 31 දිනට වසර 05 කට වැඩි කාලයක් ඉක්මවා ඇති කොන්ත්‍රාත් රඳවුම් මුදල් රු.1.786. 008 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2023 දෙසැම්බර් 31 දිනට පැවති වසර 05 කට අධික කාලයක සිට පැවත එන රු.1.203.583 ක ණයගැති ශේෂ අයකරගැනීමට නිසි ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.

(ඇ) 2023 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ ඇතුළත් එක් එක් ක්‍රියාකාරකමට අදාල කාර්යසාධන දර්ශක හඳුනාගෙන නොතිබීමත්, එම ක්‍රියාකාරකම්වලට අදාළ මූලික කාර්යසාධන දර්ශකයන්ට (Key Performance Indicators) අනුකූලවන පරිදි කාර්යසාධන වාර්තාව පිළියෙල කර නොතිබීමත් හේතුවෙන් එම ක්‍රියාකාරකම්වලින් අපේක්ෂිත අරමුණු ඉටුකරගෙන තිබේද යන්න ඍජුව හඳුනා ගැනීමට නොහැකි විය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

7 | 8

# පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

4:1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100%-90% | 75%-89% | 50%-74% |
| ***ගිණුම් අංශය*** | | | |
| වාර්ෂික ගිණුම් වාර්ථා සකස් කිරීම 2023 | ✓ | | |
| 2023 වාරශික ඇස්තමේන්තු සකස් කිරීම | ✓ | | |
| මාසික වැටුප් සැකසීම | ✓ | | |
| 2023 මාසික ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීම | ✓ | | |
| බැංකු සැසදුම් ප්‍රකාශ සකස් කිරීම | ✓ | | |
| විගණන විමසුම් සඳහා පිළිතුරු යැවීම | ✓ | | |
| ගිණුම් පියවීම 2023 | ✓ | | |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂන සිදුකිරීම | ✓ | | |
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම 2023 | ✓ | | |
| 2023 අවසන් මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීම හා අත්තිකාරම් ගිණුම සකස් කිරීම | ✓ | | |
| ***පාලන අංශය*** | | | |
| ආයතනය තුල, කඩදාසි භාවිතය අවම කිරීම හා ලිපි ද්‍රව්‍ය භාවිතය කලමනාකාරණය කිරීම, ඵලදායි නිවැරදි වැඩ පරිසරයක් පවත්වාගෙන යාම | ✓ | | |
| කාර්ය මණ්ඩල පුහුණු වැඩමුළු හා දැනුම බෙදාගැනීම හා සාමාන්‍ය පරිපාලනය හා ක්‍රියාවලීන් සංවර්ධනය කිරීම | ✓ | | |
| 2023 ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | ✓ | | |
| නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු යාවත් කාලීන කිරීම | ✓ | | |
| වැටුප් වර්ධක,ණය හා නිවාඩු අනුමත කිරීම | ✓ | | |
| කාර්ය සාධන වාර්ථා සකස් කිරීම | ✓ | | |
| වාහන කළමනාකරණය,රක්ෂණය හා ආදායම් බලපත්‍ර, සේවා කිරීම හා නඩත්තු කිරීම | ✓ | | |
| ***වැඩසටහන් අංශය*** | | | |
| ක්‍රියාකාරී සැලැස්මට අදාළ වැඩසටහන් පැවැත්වීම | | ✓ | |
| කාලාකරු දීමනා ලබාදීම හා වෛද්‍යාධාර ලබාදීම | ✓ | | |
| පාඨමාලා පැවැත්වීම | ✓ | | |
| නව පාඨමාලා සඳහා විෂය නිර්දේශ සකස් කිරීම | ✓ | | |
| පොත්පත් එලිදැක්වීම | ✓ | | |

# පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

## 5.1 හඳුනාගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

5:1 හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| 3 | - | කලාකරුවන් සඳහා අලුත් අවුරුදු තිළිණ ප්‍රදානය | | | ✓ |
| 3 | - | වියපත් කලා ශිල්පීන් සඳහා වෛද්‍ය සායන පැවැත්වීම | | | ✓ |
| 4 | 4:1 හා 4:2 | නිර්මාතෘවරු සහ සේවය කරමින් සිටියදී මියගිය සේවකයින් ගුණානුස්මරණය | | | ✓ |
| 4 | 4:2 | ටවර් සංකථන මණ්ඩපය | | | ✓ |
| 4 | 4:2 | අපේක්ෂාවේ වේදිකා මංගල්‍යය "ටවර් නාට්‍ය උළෙල-2023" | | | ✓ |
| 4 | 4:2 | ටවර් ප්‍රභාෂ්වර ප්‍රසංගය | | | ✓ |
| 4 | 4:2 | ලෝක නාට්‍ය දින සැමරුම් උත්සවය පැවැත්වීම | | | ✓ |
| 4 | 4:2 | නාට්‍ය නිෂ්පාදනය (සිංහල) | | | ✓ |
| 4 | - | සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගාවලිය 2022 - 2023 | | | ✓ |
| 4 | - | රුක්මණීදේවි සැමරුම් වැඩසටහන | | | ✓ |
| 4 | 4:1 | බොදු බැති ගී ප්‍රසංග පැවැත්වීම | | | ✓ |
| 4 | 4:1 හා 4:2 | ලාංකේය නෘත්‍ය සංගීත කලාවේ ලයනල් ගුණතිලක සංප්‍රවේශය කෘතිය | | | ✓ |
| 3 | 4.1 | නාට්‍ය හා රංගකලා පාසල පැවැත්වීම (සිංහල මාධ්‍ය) | | | ✓ |
| 4 | 4.2 | අධ්‍යයන වර්ෂ 2020/21 /2021/2022 සිසුන්ගේ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය පැවැත්වීම | | | ✓ |
| 3 | - | නාට්‍ය හා රංගකලා පාසල පැවැත්වීම (දෙමළ මාධ්‍ය) | | | ✓ |
| 4 | 4:1 | සරස්වතී පූජාව පැවැත්වීම | | | ✓ |
| 4 | 4:1 හා 4:2 | සංගීතය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍ය) මූලික කටයුතු ඉටු කිරීම | ✓ | | |
| 4 | 4:1 හා 4:2 | නර්තනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල මාධ්‍ය) මූලික කටයුතු ඉටු කිරීම | ✓ | | |
| 4 | 4:1 හා 4:2 | සංගීතය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (දෙමළ මාධ්‍ය) මූලික කටයුතු ඉටු කිරීම | ✓ | | |
| 4 | 4:1 හා 4:2 | නර්තනය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව (දෙමළ මාධ්‍ය) මූලික කටයුතු ඉටු කිරීම | ✓ | | |
| 4 | 4:1 හා 4:2 | උසස් ඩිප්ලෝමා පාඨමාලා හදාරන විද්‍යාර්ථීන් සඳහා නායකත්ව පුහුණු වැඩසටහන | | | ✓ |

| | | | | | |
|---|---|---|---|---|---|
| 4 | 4:1 හා 4:2 | රංගනය පිළිබඳ වෘත්තීය පාඨමාලාවේ විෂය නිර්දේශය සකස් කිරීම සහ ප්‍රමිතිගත කිරීම | | | ✓ |
| 4 | - | රංගනය පිළිබඳ වෘත්තීය පාඨමාලාව | | | ✓ |
| 4 | 4:1 හා 4:2 | අන්තර් ජාතික ප්‍රාසාංගික කලා හුවමාරු වැඩසටහන් හා විදෙස් නාට්‍ය උළෙල නියෝජනය කිරීම | | ✓ | |
| 4 | 4:1 හා 4:2 | හාත්බණ්ඩ නැටුම්/ සංගීත විභාගය | | ✓ | |
| 4 | 4:1 හා 4:2 | නාට්‍ය හා රංගකලා එක්දින පුහුණු ප්‍රායෝගික වැඩමුළු පැවැත්වීම | | | ✓ |
| 4 | 4:2 | රුක්මණී දේවි සංගමයේ සාමාජිකයින් සඳහා එක්දින රසවින්දන වැඩමුළුවක් පැවැත්වීම | | | ✓ |
| 4 | 4:1 හා 4:2 | ටවර් යොවුන් සමුළුව | | | ✓ |
| 4 | 4:2 | ටවර් කලා ශිල්පී එකමුතුව | | | ✓ |
| 4 | 4:2 | ටවර් වියපත් කලාකරු අරමුදලට ආධාර පිණිස සංගීත ප්‍රසංගයක් පැවැත්වීමට අදාළ මූලික කටයුතු සංවිධානය | | | ✓ |
| 4 | 4.2 | වේදිකා නාට්‍ය කරුවන්ගේ නාමාවලිය (සිංහල හා දෙමළ) | | | ✓ |
| 4 | 4.2 | නාට්‍ය හා රංගකලා පාසලේ සිසුන්ගේ අධ්‍යයන වර්ෂ අවසන් නාට්‍ය නිෂ්පාදනය (සිංහල) | | | ✓ |
| 4 | | කලාකරුවන් සඳහා වන්දනා චාරිකාව | | | ✓ |
| 4 | 4.1 හා 4.2 | යූ ටියුබ් නාලිකාව | | | ✓ |
| 4 | | රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව වැඩසටහන | | | ✓ |
| 4 | - | ටවර් සම්මාන උළෙල | | | ✓ |
| 4 | | අපේක්ෂාවේ වේදිකා මංගල්‍යය "ටවර් දෙමළ නාට්‍ය උළෙල- 2023" | | | ✓ |
| 4 | 4.2 | නාට්‍ය හා රංගකලාව පිළිබ ඳ ප්‍රායෝගික පුහුණු වැඩමුළු පැවැත්වීම | | | ✓ |
| 4 | 4.2 | ජාතික සාහිත්‍ය කලා මහෝත්සවය | ✓ | | |
| 4 | | විදෙස් පුහුණුව | | ✓ | |

5:2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

<u>ජයග්‍රහණ</u>

- ✓ 2023 අපේක්ෂාවේ වේදිකා මංගල්‍ය - ටවර් නාට්‍ය උළෙල පැවැත්වීම තුලින් කොරෝනා වසංගතය හේතුවෙන් බිඳවැටී තිබූ රංගශාලා සඳහා ප්‍රේක්ෂකයින් ආකාර්ශනය කරගැනීම හා නාට්‍ය කරුවන් දිරිමත් කිරීමට හැකිවීමතුලින් නාට්‍ය කලාව ප්‍රවර්ධනය කිරීම.

- ✓ නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමා පාඨමාලාව සිසුන් 95 ක් බඳවා ගනිමින් යාපනය සංදිලිප්පායි හා වන්කානෙයි සංස්කෘතික මධ්‍යස්ථානයේ දී ආරම්භ කිරීමෙන් ජාතීන් අතර අධ්‍යාපනය සමානව බෙදාදීමට හැකිවීම.

- ✓ ජනාධිපති සුභ සාධක අරමුදලින් දීමනා ලබන කලා ශිල්පීන් **63** ක් හා සඳහා රු. **7500/-** බැගින් මාසික දීමනාව ලබාදීම සහ වෛද්‍යාධාර දීමනා ලබාදීම තුලින් වියපත් කලාකරුවන්ගේ සෞඛ්‍ය සුභසාධනය ඉහළ නැංවීමට හැකිවීම.

- ✓ ටවර් හෝල් රඟහල පදනම මගින් දීමනා ලබන කලා ශිල්පීන් 41 ක් සඳහා රු. **7500/-** බැගින් මාසිකව දීමනාව ලබාදීම සහ වෛද්‍යාධාර දීමනා ලබාදීම තුලින් වියපත් කලාකරුවන්ගේ සෞඛ්‍ය සුභසාධනය ඉහළ නැංවීමට හැකිවීම.

- ✓ ඩිප්ලෝමාධාරීන් 52 ක් සඳහා උසස් ඩිප්ලෝමා සහතික ප්‍රදානය කිරීම තුලින් නාට්‍ය හා රංගකලා ක්ෂේත්‍රයේ නියැලීමට හා උසස් අධ්‍යාපන අවස්ථා හිමිකර ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම ලඟාකරදීමට හැකිවීම.

- ✓ නාට්‍ය හා රංගකලා පාසලේ අධ්‍යයන වර්ෂ 2020/2021,2021/2022 හි ඩිප්ලෝමාධාරීන් 52 ක් අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා උපාධිය හැදෑරීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය වෙත යොමු කිරීමට හැකිවීම

- ✓ ලාංකේය නෘත්‍ය සංගීත කලාවේ ලයනල් ගුණතිලක සංප්‍රවේශය කෘතිය - ලාංකේය නෘත්‍ය සංගීත කලාවේ උන්නතිය වෙනුවෙන් ලයනල් ගුණතිලක සංප්‍රවේශය කෘතිය පිටපත් 1000ක් මුද්‍රණය කර එළිදැක්වීම

- ✓ වේදිකා නාට්‍යකරුවන්ගේ තොරතුරු ඇතුළත් නාමාවලිය සැකසීම මේ තුලින් වේදිකා නාට්‍ය ක්ෂේත්‍රෙය් නියැලෙන කලාශිල්පීන්ගේ දුරකථන අංක හා ලිපිනයන් ඇතුලත් පොත් 1000ක් මුද්‍රණය කර එළිදැක්වීම

- ✓ YouTube නාලිකාව ආරම්භ කිරීම හා Face book නාලිකාව වැඩිදියුණු කර පවත්වාගෙන යාම

- ✓ රංගනය පිලිබඳ පාඨමාලාවක් ආරම්භ කිරීම හා පාඨමාලාව සඳහා සිසුන් 33 ක් බඳවා ගැනීම

- ✓ වැඩි ඉල්ලුමක් ඇති නර්ථනය,සංගීතය පිලිබඳ (සිංහල මාධ්‍ය) පාඨමාලාවන් ආරම්භ කිරීමට අදාළ මූලික කටයුතු සිදුකිරීම

<u>අභියෝග</u>

- ✓ අගනුවරට පමණක් සීමා වී තිබූ නාට්‍ය හා රංගකලා උසස් ඩිප්ලෝමා පාඨමාලාව අගනුවරින් බැහැරව යාපනය වැනි ප්‍රදේශයක දෙමළ භාෂිත සිසු සිසුවියන් අතර ප්‍රචලිත කිරීම හා උනන්දුව ඇති කිරීම

- ✓ රංගශාලා සඳහා විදුලි බිල්පත් ගෙවීමට සිදුවීම හා බිදුලි ගාස්තු වැඩිවීම හේතුවෙන් ඉටුකිරීමට අපේක්ෂිත වැඩසටහන් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන අවමවීම

- ✓ අගනුවරින් බැහැරව සංගීතය හා නර්තනය පිලිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලා සිංහල හා දෙමළ මාධ්‍යයෙන් ආරම්භ කිරීමට කටයුතු කිරීම

- ✓ රංගනය, රංගාලෝකකරණය හා ශ්‍රව්‍ය දෘශ්‍ය සංස්කරණය යන ක්ෂේත්‍රයන් යටතේ කෙටි කාලීන පාඨමාලා ආරම්භ කිරීම

- ✓ නව පාඨමාලා ආරම්භ කිරීමට අවශ්‍ය ස්ථාන සපයාගැනීමට අපහසුවීම හා භෞතික සම්පත් වල හිගයතාවය

- ✓ වර්ථමානයේ ඇති ආර්ථික අපහසුතාවයන් හේතුවෙන් නාට්‍ය හා රංගකලා පාඨමාලාවන් හැදැරීමට නව තරුණ පරපුරේ උනන්දුව අවම වීම

- ✓ YouTube නාලිකාව පවත්වාගෙන යාම හා අදාළ සංස්කරණ කටයුතු කිරීමට නිලධාරීන් නොමැතිවීම

- ✓ සව්පිරිපාය ගොඩනැගිල්ල ටවර් හෝල් රඟහල පදනමට පවරා ගැනීමට අදාළ කටයුතු අවසන් නොවීම

- ✓ කොරෝනා වසංගතය හේතුවෙන් බිදවැටී තිබූ රංගශාලාවන් ප්‍රවර්ධන කිරීම කාලයක් ගතවීම

# පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

**ටවර් හෝල් රඟහල පදනම භාරකාර මණ්ඩලය - 2023**

නිල බලයෙන් පත්වන සාමාජිකවරු

01 ටවර් හෝල් රඟහල පදනමේ සභාපති/ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා

02 මුදල් ගරු රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ මැතිතුමා (මුදල් අමාත්‍යතුමන් නියෝජනය කිරීම)

03 රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන ගරු අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා

04 බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය විදුර වික්‍රමානයක මැතිතුමා

05 අග්‍රාමාත්‍ය ලේකම් අනුර දිසානායක මහතා

06 බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සෝමරත්න විදානපතිරණ මහතා

07 අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් එම්.එන්. රණසිංහ මහතා

08 බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ (ජාතික උරුම අංශය) අතිරේක ලේකම් (සංවර්ධන) කේ.ඒ.ඩී.ආර්. නිශාන්ති ජයසිංහ මහත්මිය

09 කොළඹ මහ නගර සභාවේ නාගරික කොමසාරිස් ජේ.එම්. භද්‍රානි ජයවර්ධන මිය

ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පත්කරන සාමාජිකවරු

**(පත්වීමේ දින සිට වසර 03 ක කාලයක් සඳහා)**

01 ජී.ආර්.පෙරේරා මහතා - 2022.11.01 – 2023.05.01
02 චරිතා ප්‍රියදර්ශනී පීරිස් මහත්මිය
03 පාලිත සිල්වා මහතා
04 නඩරාජා කාර්තික් මහතා

**මහා භාණ්ඩාගාර නියෝජනය**

රේණුකා කොළඹගේ මහත්මිය - ප්‍රධාන මූල්‍ය නිලධාරී, මුදල් අමාත්‍යාංශය

- ටවර් හෝල් රඟහල පදනමේ අධ්‍යක්ෂ ජනරාල්, ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක මහතා

**ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්**

1. අධ්‍යක්ෂ ජනරාල් - ආචාර්ය ඩී.එම්.එස් දිසානායක මහතා
2. අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන) - නිපුණ දිසානායක මහතා
3. අධ්‍යක්ෂ ( නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන හා වැඩසටහන්) - (පුරප්පාඩුව පවතී)
4. සහකාර අධ්‍යක්ෂ (මුදල්) - කසුන් දේශප්‍රිය මහතා
5. සහකාර අධ්‍යක්ෂ(පාලන හා සංවර්ධන) - (පුරප්පාඩුව පවතී)
6. සහකාර අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන, කලාකරු සුභසාධන හා වැඩසටහන්) - චන්දන බණ්ඩාර මහතා
7. සහකාර අධ්‍යක්ෂ (අධ්‍යාපන පර්යේෂණ හා සංරක්ෂණ) - (පුරප්පාඩුව පවතී)
8. සහකාර අධ්‍යක්ෂ (දෙමළ නාට්‍ය ප්‍රවර්ධන) - ආචාර්ය ෂම්මුග ෂර්මා මහතා

**අනුමත කාර්ය මණ්ඩලය හා සිටින කාර්ය මණ්ඩලය - 2023.12.31 දිනට**

| සේවා ගණය | වැටුප් කේත අංකය | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | HM-2-1 | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 |
| | HM-1-1 | අධ්‍යක්ෂ (පාලන හා සංවර්ධන) | 1 | 1 | 0 |
| | | අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන සහ වැඩසටහන්) | 1 | 0 | 1 |
| | MM-1-1 | සහකා ර අධ්‍යක්ෂ (පාලන සහ සංවර්ධන) | 1 | 0 | 1 |
| | | සහකාර අධ්‍යක්ෂ (මුදල්) | 1 | 1 | 0 |
| | | සහකාර අධ්‍යක්ෂ (අධ්‍යාපන පර්යේෂණ හා සංරක්ෂණ) | 1 | 0 | 1 |
| | | සහකාර අධ්‍යක්ෂ) නාට්‍ය ප්‍රවර්ධන කලාකරු/ සුභසාධන හා වැඩසටහන්) | 1 | 1 | 0 |
| | | සහකාර අධ්‍යක්ෂ )දෙමළ නාට්‍ය ප්‍රවර්ධන) | 1 | 1 | 0 |
| | | පරිපාලන නිලධාරී | 1 | 1 | 0 |

| | | | | | |
|---|---|---|---|---|---|
| තෘතියික මට්ටම | JM-1-1 | කළමනාකරු (රඟහල්) | 3 | 3 | 0 |
| | | අභ්‍යන්තර විගණන නිලධාරී | 1 | 1 | 0 |
| | MA-4 | සංවර්ධන සහකාර (අලෙවි) | 1 | 1 | 0 |
| | | සංවර්ධන සහකාර (ශිණුම් හා මූල්‍ය) | 1 | 1 | 0 |
| | | සම්බන්ධීකරණ නිලධාරී (පාඨමාලා) | 1 | 1 | 0 |
| | | සම්බන්ධීකරණ නිලධාරී (වැඩසටහන් හා ප්‍රචාරණ) | 1 | 1 | 0 |
| | | සම්බන්ධීකරණ නිලධාරී (සුභ සාධන) | 1 | 1 | 0 |
| | | ජ්‍යෙෂ්ඨ ශබ්ද පරිපාලක | 1 | 1 | 0 |
| ද්විතීය මට්ටම | MA-2-1 | වැඩ මූලික සිවිල් | 1 | 1 | 0 |
| | | තාක්ෂණික සහකාර * | 1 | 1 | 0 |
| | | ශබ්ද පරිපාලක | 1 | 0 | 1 |
| | | පොත් තබන්නා | 1 | 1 | 0 |
| | MA- 1-1 | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | 26 | 17 | 9 |
| | | කළමනාකරණ සහකාර (මුදල් අයකැමි) | 1 | 1 | 0 |
| | | කළමනාකරණ සහකාර (දෙමළ භාෂිත) | 1 | 1 | 0 |
| ප්‍රාථමික මට්ටම | PL-3 | රියැදුරු | 6 | 3 | 3 |
| | | විදුලි කාර්මික ශිල්පී | 1 | 1 | 0 |
| | | ශබ්ද ක්‍රියාකරු | 4 | 1 | 3 |
| | | රංගාලෝක ශිල්පී | 3 | 2 | 1 |
| | | නඩත්තුරු | 1 | 1 | 0 |
| | PL-2 | රංගාලෝක ශිල්පී සහායක | 3 | 2 | 1 |
| | PL-1 | කාර්යාල සහායක | 7 | 4 | 3 |
| | | රංගශාලා සහායක | 8 | 5 | 3 |
| | | පාලන මැදිරි සහායක | 1 | 0 | 1 |
| | | රංග සේවා මැදිරි සහායක | 1 | 1 | 0 |
| | | කෞතුකාගාර ලේඛනාගාර සහායක / | 1 | 1 | 0 |
| | | ශබ්ද ක්‍රියාකරු සහායක | 3 | 3 | 0 |
| | | පොත් අලෙවිහල සහායක | 1 | 1 | 0 |
| | | **එකතුව** | **91** | **63** | **28** |

<u>පුද්ගලික වන සේ අනුමත තනතුරු</u>

| | | | | | |
|---|---|---|---|---|---|
| ද්විතියික මට්ටම | MA-2-1 | පරිගණක ක්‍රියාකරු | 01 | 01 | 0 |
| ප්‍රාථමික මට්ටම | PL-2 | කළමනාකාර සහායක | 02 | 02 | 0 |
| | | මුළු එකතුව | 94 | 66 | 28 |

- තාක්ෂණික සහකාර තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇත.
- කළමනාකරණ සහකාර එක් අයෙකු වසර 05 ක වැටුප් රහිත නිවාඩු ලබා ඇත.
- රංගාලෝක ශිල්පී එක් අයෙකු විදෙස් නිවාඩු ඉල්ලුම් කර විදෙස් ගතවී ඇති බැවින් විදෙස් නිවාඩු අනුමැතියට යොමු කර ඇත.

**කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම**

නෙෂාන් ධනුෂ්ක මහතා තාක්ෂණික සහකාර - 2023.09.14 සිට 2025.09.15 දක්වා

**ඉල්ලා අස්වීම් - 2023**

| අංකය | නම | තනතුර | පත්වීම් දිනය | ඉල්ලා අස්වූ දිනය |
|---|---|---|---|---|
| 01 | පවනි යසෝරා මිය | කළමනාකරණ සහකාර | 2019-08-01 | 2023-01-02 |
| 01 | නිමල් විජේසුන්දර මහතා | රියැදුරු | 2001-08-15 | 2023-01-31 |
| 03 | නිල්මිණි වසන්තා හේරත් මිය | සම්බන්ධීකාරක (සංගීත) | 2001.10.01 | 2023-02-28 |
| 04 | නිලන්ත සිසිරකුමාර මහතා | කළමනාකරණ සහකාර | 2016-10-03 | 2023-04-30 |
| 05 | මංගලී කුමාරි බන්නැහැක මිය | කළමනාකරණ සහකාර | 2016-10-03 | 2023-10-04 |

**6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිගය හෝ අතිරික්තයට බලපාන ආකාරය**

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 91 ක් වන අතර නිත්‍ය කාර්ය මණ්ඩලය 63 ක් විය.ඒ අනුව පුරප්පාඩු වූ තනතුරු පහත පරිදි වේ.

01. අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන සහ වැඩසටහන්) 01

02. සහකාර අධ්‍යක්ෂ (පාලන සහ සංවර්ධන) 01

03. සහකාර අධ්‍යක්ෂ (අධ්‍යාපන පර්යේෂණ හා සංරක්ෂණ) 01

04. තාක්ෂණික සහකාර 01

05. ශබ්ද පරිපාලක 01

06. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) 09

07. රියදුරු 03

08. ශබ්ද ක්‍රියාකරු 03

09. රංගාලෝක ශිල්පී 01

10. රංගාලෝක ශිල්පී සහායක 01

11. කාර්යාල සහායක 03

12. රංගශාලා සහායක 03

13. පාලන මැදිරි සහායක 01

වරින්වර නිකුත්කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව සහ ආයතනික වියදම් පරිපාලනය මත ඉහත සඳහන් තනතුරු සියල්ල බඳවා ගැනීමට නොහැකි විය.

එසේ වුවද අත්‍යවශ්‍ය තනතුරුවල අවශ්‍යතාවය පෙන්වා තනතුරු කිහිපයක් අලුතින් බඳවා ගැනීමට අනුමැතිය ගත්තද සුදුසු අයවලුන් ඉදිරිපත් නොවීම මත අධ්‍යකෂ(නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන හා වැඩසටහන්),සහකාර අධ්‍යක්ෂ(අධ්‍යාපන පර්යේෂණ හා සංරක්ෂණ),තාක්ෂණික සහකාර යන තනතුරු කිහිපයක් බඳවා ගැනීමට නොහැකි විය.

ඒ අනුව අධ්‍යකෂ(නාට්‍ය ප්‍රවර්ධන අධ්‍යාපන හා වැඩසටහන්),සහකාර අධ්‍යක්ෂ(අධ්‍යාපන පර්යේෂණ හා සංරක්ෂණ) අත්‍යාවශ්‍ය තනතුරු බඳවා ගැනීමට නොහැකි වීම මත ටවර් හෝල් රඟහල පදනම මගින් පවත්වාගෙන යනු ලබන නාට්‍ය පාසල් වල හා සංරක්ෂණ කටයුතු සිදුකර ගැනීම ඉතා අසීරු විය.

එමෙන්ම තාක්ෂණික සහකාර තනතුර සඳහා ස්ථිර අයකු බඳවා ගැනීමට නොහැකිවීම මත ආයතනික කටයුතු ඩිජිටල්කරණයට ලක් කිරීමට අසීරු විය.

## <u>6.3 මානව සම්පත් සංවර්ධනය</u>

**කාර්ය මණ්ඩල පුහුණු පාඨමාලා වලට අදාළ තොරතුරු - 2023**

| වැඩසටහනේ නම | පුහුනු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය | වැඩසටහනේ ස්භාවය (දේශීය/විදේශීය) | නිමැවුම/ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|
| 01.වාර්ෂික ගබඩා සමීක්ෂණය | 02 | දින 01 | රු 27,000.00 | දේශීය | නිවැරදිව ගබඩා සමීක්ෂනයසිදු කරන ආකාරය |
| 02.ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 01 | දින 02 | රු 9,500.00 | දේශීය | නිවැරදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය |
| 03. විධිමත් ලිපිගොනුකරණය | 01 | දින 01 | රු 13,500.00 | දේශීය | විධිමත් ලිපිගොනුවක් පවත්වා ගැනීම සම්බන්ධව |
| 04. ගිණුම් ලිපිකරුවන්ගේ කාර්යභාරය | 02 | දින 02 | රු 19,000.00 | දේශීය | නිවැරදි ගිණුම්කරන කටයුතු සම්බන්ධව |
| 05. ගුණාත්මක වැඩපරිසරයක් සඳහා වෘත්තීය සංවර්ධනය | 02 | දින 01 | රු 10,000.00 | දේශීය | වෘතීය කාර්යක්ෂමතාවය හා ධානාත්මක ආකල්ප සංවර්ධනය |

ආයතනයේ කටයුතු සඳහා සෘජුව දායකවන කාර්යමණ්ඩල සාමාජිකයන්ට ඉහත සඳහන් වැඩසටහන් මගින් ලබා දුන් පුහුනුව මගින් ඔවුන්ගේ විෂයානුබද්ධ දැනුම වර්ධනය කිරීමට හැකි විය.

ඒ හරහා ආයතනයේ කාර්යසාධනය ඉහල මට්ටමකට පත්වූ බව සඳහන් කල හැකි අතර මෙම පුහුණු හරහා කාර්යමණ්ඩල සමාජිකයන්ගේ ආකල්ප ධානාත්මකව වර්ධනය වූ බැවින් ඔවුන්ගේ කාර්යක්ෂමභාවය වැඩිවීම හා නිවැරදිව තම කටයුතු ඉටු කිරීමට හැකි වීම ආයතනයේ අභිවෘද්ධියට පිටුවහලක් විය.

# 07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල නොවේ | අර්ධ රාජ්‍ය ව්‍යාවස්ථාපිත ආයතනයක් බැවින් මෙම ගිණුම් භාවිතා නොවේ | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | | |
| 1.6 | වෙනත් | අනුකූල නොවේ | | |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල නොවේ | සියළුම මාසික ගිණුම් සාරාංශ අමාත්‍යාංශය වෙත යොමු කරන අතර අමාත්‍යාංශය මගින් අදාල වාර්තා මහා භාණ්ඩාගාරයට යොමු කරනු ලැබේ | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20)යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූලවේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරික්ෂා කිරීම | අනුකූල නොවේ | ඉන්ධන ලබා දීම සීමා සහිත වීම හා ඉන්ධන දහන පරික්ෂාව සිදු කිරීම සඳහා සුදුසු ආයතනයක් සොයා ගැනීම අපහසු වීම | අමාත්‍යාංශයේ නම් කල නිලධාරියෙකු හා ආයතනයේ මාණ්ඩලික නිලධාරීන් යොදාගෙන සිදු කිරීමට තීරණය කර ඇත |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 12 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම. | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල නොවේ | අර්ධ රාජ්‍ය ව්‍යාවස්ථාපිත ආයතනයක් බැවින් මෙම ගිණුම් භාවිතා නොවේ | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල නොවේ | | |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල නොවේ | අර්ධ රාජ්‍ය ව්‍යාවස්ථාපිත ආයතනයක් බැවින් මෙම ගිණුම් භාවිතා නොවේ | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල නොවේ | අර්ධ රාජ්‍ය ව්‍යාවස්ථාපිත ආයතනයක් බැවින් මෙම ගිණුම් භාවිතා නොවේ | |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල නොවේ | අර්ධ රාජ්‍ය ව්‍යාවස්ථාපිත ආයතනයක් බැවින් මෙම ගිණුම් භාවිතා නොවේ | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට ඍජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල නොවේ | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල නොවේ | | 2024 සිට ක්‍රියාත්මක කර ඇත |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල නොවේ | | 2024 සිට ක්‍රියාත්මක කර ඇත |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | | 2024 සිට ක්‍රියාත්මක කර ඇත |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ | | 2024 වසරේ සිට මූලික රැස්වීමක් පවත්වා ආරම්භ කර ඇත. |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | | 2024 වසරේ සිට මූලික රැස්වීමක් පවත්වා ආරම්භ කර ඇත |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | රාජ්‍ය වියදම් පාලනය සීමා චක්‍රෙල්ක යටතේ තාවකාලිකව නවතා ඇත. | 2024 වසරේ සකස් කරමින් පවතී |

| | | | | |
|---|---|---|---|---|
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල නොවේ | ආයතනයේ මූල්‍ය තත්වය හා අවශ්‍යතාවය අනුව පුහුණු වැඩසටහන් සඳහා කාර්ය මණ්ඩලය යොදවා ඇත. | ඉදිරියේදි සකස් කරනු ලබන මානව සම්පත් සංවර්ධන සැලැස්මට මෙය ඇතුලත් කර ඇත |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | මෙම චක්‍රලේඛ ඇමුනුම් පදනම් කර ගනිමින් වාර්ෂික කාර්ය සාදන ඇගයීම් සිදු කරනු ලබයි | ඉදිරියේදි මෙම චක්‍රලේඛය අනුව කටයුතු සකස් කරමින් පවතී |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |